
2021 කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT



රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
වැවිලි අමාත්‍යාංශය

இறப்பர் அபிவிருத்தித் திணைக்களம்
பெருந்தோட்ட அமைச்சு

RUBBER DEVELOPMENT DEPARTMENT
MINISTRY OF PLANTATION

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ශ්‍රී ලාංකීය අපනයන ආර්ථිකයේ අතිශය වැදගත් ස්ථානයක් හිමිකරගෙන ඇති දේශීය රබර් කර්මාන්තය 2021 වර්ෂයේ දී සැළකිය යුතු වර්ධනයක් අත්කර ගෙන ඇත. කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය සෑම ක්ෂේත්‍රයකටම දැඩි සේ සෘණාත්මක බලපෑම් එල්ල කරනු ලැබුවද, එම වසංගත තත්ත්වය නිසාම රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉල්ලුමේ ඇති වූ වැඩිවීම එම උන්නතියට හේතු වී ඇත.

පසුගිය වසර කිහිපයට සාපේක්ෂව 2021 වසරේ රබර් මිල ඉහළ යාම හේතුවෙන් රබර් වගාව සඳහා යොමුවන ගොවීන්ගේ වැඩිවීමේ ප්‍රවණතාවක් ද ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ කුඩා වතු අංශයේ නැවත වගා ඉලක්කය වූ හෙක්. 500 අභිබවමින් හෙක්. 560ක බිම් ප්‍රමාණයක් වගා කිරීමට හැකි වී ඇත. එසේම වැවිලි අංශය විසින් ද නැවත වගා යටතේ 91%ක භෞතික ප්‍රගතියක් අත් කර ගනිමින් හෙක්. 906 ක රබර් නැවත වගාව සිදු කර ඇත. මෙම වසර තුළ පැළ 1,277,232 නිපදවීමට රජයේ පැළ තවාන් මඟින් හැකියාව ලැබී ඇත. එම නිෂ්පාදිත සාර්ථක බද්ධ රබර් පැළ කුඩා වතු අංශය හා STaRR ව්‍යාපෘතිය වෙත නැවත වගාව හා නව වගාව සඳහා නිකුත් කිරීමට කටයුතු කර ඇත.

පසුගිය වසර කීපය තුළ දෙපාර්තමේන්තුව විසින් වැහි ආවරණ යෙදීම රබර් වගාකරුවන් අතර ජනප්‍රිය කරවීමට ගත් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස මෙම වසර තුළ වැහි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ කුඩා වතු අංශයේ හෙක්. 500ක ඉලක්කය අනුව හෙක්. 1,237ක වැහි ආවරණ යොදමින් 247% ක භෞතික ප්‍රගතියක් අත් කර ගෙන ඇත. ඒ හා සමානවම වර්ධනීය ලෙස වැවිලි සමාගම් අංශය විසින් ද හෙක්. 4,561ක බිම් ප්‍රමාණයක වැහි ආවරණ යොදා 152% ක ප්‍රගතියක් අත් කර ගැනීමට හැකියාව ලැබී ඇත. මෙම තත්ත්වය තුළ වර්ෂා කාලවලදී ද අස්වනු නෙළීමට හැකියාව ලැබීමෙන් වාර්ෂික රබර් නිෂ්පාදනය ස්ථායීව පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත.

නිරෝධායන නීති හා සෞඛ්‍ය අමාත්‍යාංශ මාර්ගෝපදේශ අනුව 2021 වසරේදී රාජ්‍ය ආයතන ක්‍රියාත්මක වීමට සිදු වීම හේතුවෙන් හා පිරිස් ඒකරාශි කිරීමට නොහැකි වීම තුළ සැලසුම් කළ පරිදි රබර් ආශ්‍රිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හේතුවෙන් සමස්ත පුහුණු වැඩසටහන්හි ප්‍රගතිය අපේක්ෂිත මට්ටම ළඟා කර ගැනීම අපහසු වී ඇත.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 කාර්ය සාධන වාර්තාව තුළින් රබර් ක්ෂේත්‍රයට අදාළව මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් මඟින් අත් කර ගත් ප්‍රගතිය ඉදිරිපත් කර ඇති අතර, ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යනය කිරීම හා එහි උන්නතිය උදෙසා ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලදී ද මෙම වාර්තාව උපයෝගී කර ගැනීමට හැකි වනු ඇතැයි උදක්ම විශ්වාස කරමි.

මාධව වර්ණකුලසූරිය
අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

පටුන

අප ගැන **1**

දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු **2**

1. හැඳින්වීම **03-09**

1.1. ඓතිහාසික පසුබිම 3
1.2. රබර් වගාව 4
1.3. ආයතනයේ ප්‍රධාන කාර්යයන් 5
1.3.1.ප්‍රධාන කාර්යාලයේ කාර්යයන් 5
1.3.2.ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන කාර්යයන් 5
1.3.3.රබර් පැළ තවාන්වල කාර්යයන් 5
1.4. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 6
1.5. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය 7
1.6. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු 8-9

2. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්හි ප්‍රගතිය **10-61**

2.1. රබර් නැවත වගාව 10
2.1.1.රබර් නැවත වගාව - කුඩාවතු අංශය 11
2.1.2.රබර් නැවත වගාව - වැවිලි අංශය 13
2.2. රබර් නව වගාව 14
2.2.1.රබර් නව වගාව - කුඩා වතු අංශය 15
2.2.2.රබර් නව වගාව - කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය 18
2.3. රබර් වගාව සඳහා සහනාධාර ගෙවීම - 2021 20
2.4. රබර් පැළ නිෂ්පාදනය 20
2.4.1.රජයේ පැළ තවාන් 20
2.4.2.පැළ නිෂ්පාදනය (පෞද්ගලික පැළ තවාන්) 23
2.5. වැසි ආවරණ යෙදීමේ වැඩසටහන 24
2.6. අතුරු බෝග වගාව 27
2.7. රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන් 30
2.7.1.කිරි කැපුම් ශිල්පී පුහුණුව 30
2.7.2.බද්ධකරුවන් පුහුණුව 32
2.7.3.වැසි ආවරණ යෙදීමට පුහුණුව 32
2.7.4.පාංශු සංරක්ෂණ පුහුණුව 33
2.8. 2021 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 34
2.9. එක් දින වියළුම් කුටීර ඉදි කිරීම හා ඇඹරුම් රෝල් ලබා දීම 37
2.10. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු- 2021 40
2.10.1. රබර් වගා බිම් ප්‍රමාණය 40
2.10.2. රබර් නිෂ්පාදනය 41
2.10.3. රබර් නිෂ්පාදන වියදම 43
2.10.4. දේශීය රබර් පරිභෝජනය 43
2.10.5. ස්වාභාවික රබර් අපනයනය 44
2.10.6. ශ්‍රී ලංකාවේ සමස්ත රබර් අපනයනය 45

2.10.7. ස්වභාවික රබර් ආනයනය 46
2.10.8. ස්වභාවික රබර් මිල 48
2.10.8.1. රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබා ගත් මිලෙහි මාසික සාමාන්‍යය 51
2.11. බලපත්‍රලාභී රබර් වෙළඳුන් පිළිබඳ තොරතුරු 52
2.12. ඒකාබද්ධ අරමුදල 53
2.13. සෙස් බදු අය කිරීම. 54

3. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය 56-67

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 56
3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 57
3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය 58
3.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 58
3.5. විගණකාධිපති වාර්තාව 59
3.6. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 65
3.7. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 65

4. කාර්ය සාධන දර්ශක 68

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 68

5. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය 69-71

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 69
5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 71

6. මානව සම්පත් පැතිකඩ 72-75

6.1. සේවක සංඛ්‍යා කළමණාකරණය 72
6.2. මානව සම්පත් සංවර්ධනය 72
6.3. රජයේ පැළ තවාන්වල සේවක සංඛ්‍යාව - 2021.12.31 දිනට 73
6.4. ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්හි දායකත්වය 73
6.5. 2021 වර්ෂයේ ඉදි කිරීම් ප්‍රගතිය 75

7. අනුකූලතා වාර්තාව 76-81

අප ගැන.....

ශ්‍රී ලංකාවේ දේශීය අපනයන ආර්ථිකයේ ආරම්භය සනිටුහන් කළ ප්‍රධාන වැවිලි බෝග ත්‍රිත්වය අතරින් අද දක්වාම ආර්ථිකය තුළ කැපී පෙනෙන ස්ථානයක් හිමි කර ගත් රබර් වගාවේ අභිවෘද්ධිය උදෙසා වර්ෂ 1934 දී අංක 6 දරණ ආඥා පනත මගින් රබර් පාලන දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලදී. ආරම්භයේදී පළමු රබර් පාලකවරයා වශයෙන් පත් වූ පී.සරවනමුත්තු මහතාගේ අවධියේ පටන් රබර් ව්‍යාප්ත කිරීමේ සේවා, පැළ නිෂ්පාදනය, පොහොර බෙදා දීම යන වගාව සඳහා අවැසි මූලික සේවා සැපයීම ඇතුළු අවශ්‍ය අනෙකුත් සේවා සැපයීමක් දෙපාර්තමේන්තුව මඟින් සිදු කරමින් පවතී.

වර්ෂ 1994 දී ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව රබර් පාලන දෙපාර්තමේන්තුව වෙනුවට, රබර් වගාවේ උන්නතිය උදෙසා අවැසි තාක්ෂණික, විද්‍යානුකූල සහයෝගයන් සහ මූල්‍ය සහයෝගය වඩාත් ශක්තිමත් ලෙස ඒකාබද්ධ කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. වැවිලි අමාත්‍යාංශය යටතේ දැනට ක්‍රියාත්මක රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වඩාත් නවීන තාක්ෂණික ක්‍රමවේද හා උපායමාර්ග භාවිත කරමින් රබර් වගාව සාම්ප්‍රදායික ප්‍රදේශවල මෙන්ම සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වෙත ව්‍යාප්ත කිරීම, ඒ ආශ්‍රිත සංවර්ධන කටයුතු, සහනාධාර ගෙවීම්, පැළ නිෂ්පාදනය කිරීම හා බෙදාහැරීම, වගා කටයුතු සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම, රබර් ඉඩම් හා රබර් මිලදී ගන්නන් ලියාපදිංචි කිරීම, පැළ තවාන් පවත්වා ගෙන යාම, රබර් සමඟ අතුරු බෝග වගාව, සෙස් බදු පරිපාලනය ආදි කාර්යයන් ඉටු කරනු ලබයි.

බත්තරමුල්ල, ගනහේන, නො:465 දරණ ස්ථානයේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති අතර, දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවා දිවයිනම ආවරණය වන පරිදි කෑගල්ල, කළුතර, රත්නපුර, ගාල්ල හා මොනරාගල යන නගරවල පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල 05 ක් මඟින් ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. එසේම එම කාර්යාල මඟින් අධීක්ෂණය වන පැළ තවාන් 08 ක් වැලිකඩමුල්ල, මීරිගම, ඇඟල්ඔය, ගුරුගොඩ, කරපිංච, මිද්දෙණිය, කුඹුක්කන හා පදියතලාව යන ප්‍රදේශවල පිහිටුවා ඇත. එම තවාන් මඟින් ජාතික පැළ අවශ්‍යතාවය සඳහා රබර් පැළ නිෂ්පාදනය, පැළ බෙදා හැරීම හා ආදර්ශ වගාවන් පවත්වාගෙන යාම සිදු කරනු ලැබේ.

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම කොටස්කරු වීම.

මෙහෙවර

නෛතිකව දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ට අනුගතව ශ්‍රී ලංකාවේ රබර් වගාව හා රබර් වගාව ආශ්‍රිත කර්මාන්තයන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා ව්‍යාප්ති සේවා ක්‍රියාත්මක කිරීම

ආයතනයේ අරමුණු

- පවතින රබර් වගා ඉඩම්හි ඵලදායීතාවය ඉහළ නැංවීම හා රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම තුළින් දේශීය රබර් නිෂ්පාදනය ඉහළ නැංවීම.
- රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම තුළින් රබර් සඳහා වැඩි මිලක් ලබා ගැනීම හා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම.
- ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය ඉහළ නැංවීම තුළින් සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- දේශීය දැව අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා දායක වීම.
- ස්වභාවික පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා වගාවේ තිරසාරභාවය තහවුරු කිරීම.

1. හැඳින්වීම

රබර් කාර්මික අමුද්‍රව්‍යක් ලෙස හඳුනා ගැනීම, කර්මාන්ත ක්ෂේත්‍රයේ සාධනීය හැරවුම් ලක්ෂයක් බවට පත්විය. ඒ සඳහා රබර් වල පවතින රබර්වලට ආවේණික ප්‍රශස්තතාවය, ප්‍රත්‍යස්ථතාවය, ඇලෙන සුළු බව, විද්‍යුත් පරිවාරක ගුණය, කම්පන උරා ගැනීමේ හැකියාව, ඕනෑම හැඩයකට සකස් කර ගැනීමේ හැකියාව, ජලය උරා නොගන්නා ගුණය ආදි ගුණාංග ඉවහල් විය. රබර්වල එකී ගුණ ප්‍රයෝජනයට ගනිමින් ලෝකය පුරා මෝටර් රථ කර්මාන්තය, ඉදිකිරීම් කර්මාන්තය, කෘෂිකර්මාන්තය, සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා අංශය, ගෘහස්ථ පරිභෝජන උපාංග නිෂ්පාදනය ආදි ක්ෂේත්‍ර රැසකම සැළකිය යුතු දියුණුවක් ලබා ඇත. ඊට අමතරව ස්වාභාවික පාරිසරික තුලිතතාවය බිඳවැටෙන අවධියක කෘත්‍රිම වන වගාවක් ලෙස රබර් ශාකය පරිසර සමතුලිතතාවය සුරැකීමට මනා පිටිවහලක් ලබා දී ඇත.

1.1. ඓතිහාසික පසුබිම

බ්‍රසීලය නිජබිම කර ගත් රබර් ශාකය මෙරටට හඳුන්වා දෙන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේදී ය. බ්‍රිතාන්‍ය ජාතික හෙන්රි වික්හැම් (Henry Wickham) විසින් බ්‍රිතාන්‍යයේ සිට ගෙන්වන ලද රබර් පැළ උපයෝගි කර ගෙන ගම්පහ හෙනරත්ගොඩ උද්භිත උද්‍යානයේ මුල්ම රබර් ශාකය රෝපණය කර ඇත. ඒ වනවිට බ්‍රිතාන්‍ය පාලනයට යටත්ව තිබූ ශ්‍රී ලංකාවේ වතු වගාව ආරම්භ වී තිබූ අතර කෝපි වගාව වාණිජ බෝගය ලෙස ව්‍යාප්තව තිබිණි. ඒ වනවිට කෝපි වගාවට බලපෑ දිලීර රෝගය නිසා එහි අස්වැන්න ශීඝ්‍රයෙන් පහත වැටුණු අතර කොකෝවා හා සිංකෝනා වගා ආරම්භ කළ ද, වගාවට අවශ්‍ය සාධක හිතකර නොවීම, ඉල්ලුම ශීඝ්‍රයෙන් අඩු වීම යන කාරණා හේතුවෙන් ඉන් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට අසීරු විය. ඒ අනුව වාණිජ බෝගයක් ලෙස ප්‍රචලිත කිරීමට සුදුසු බෝගයක අවශ්‍යතාව පැන නැඟී තිබූ අවධියක රබර් ශාකය මෙරටට හඳුන්වා දීම තුළ වතු වගාවේ විප්ලවීය පරිවර්තනයක් සිදු ව ඇත. එම නිසා කෝපි වගාවේ අර්බුද හමුවේ පීඩාවට පත් වූ වැවිලිකරුවන් අතර රබර් වගාව ශීඝ්‍රයෙන් ව්‍යාප්ත කිරීමට හැකි ව ඇත.

ක්‍රි.ව. 1914 වනවිට ජාත්‍යන්තර වෙළඳපොළ වෙත සපයන රබර් නිෂ්පාදනයෙන් 60% ක් ශ්‍රී ලංකාව සපයා ඇත. හෙන්රි වික්හැම් විසින් ශ්‍රී ලංකාවට රබර් වගාව හඳුන්වා දීමෙන් පසුව මැලේසියාව, ඉන්දුනිසියාව, සිංගප්පුරුව, චීනය ආදි ආසියාතික රටවල් වෙත ද රබර් වගාව හඳුන්වා දෙන ලදී. ක්‍රි.ව. 1906 වන විට රබර් ශාකයේ මව්බිම වූ බ්‍රසීලයට මෙරටින් රබර් පැළ අපනයනය කිරීමට ශ්‍රී ලංකාව සමත්ව ඇත. ක්‍රි.ව.1934 රබර් වගා කිරීමට සම්බන්ධ සියලු රටවල් 'ජාත්‍යන්තර රබර් නියාමන ගිවිසුම' (International Rubber Regulations Agreement) නම් වූ පොදු එකඟතාවයකට අත්සන් කළ අතර එමඟින් රබර් පාලනය හා සංවර්ධනය සඳහා රාජ්‍ය ආයතන ඒ ඒ රටවල් තුළ බිහි කිරීමට පියවර ගන්නා ලදී. රබර් කර්මාන්තයේ අත්දැකීම් බෙදා ගැනීම හා අන්තර්ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ගත් ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායම (International Rubber Study Group – IRSG) හා ස්වභාවික රබර් නිපදවන රටවල සංගමය (Association of Natural Rubber Producing Countries – ANRPC) යන අන්තර්ජාතික ආයතනයන්හි සාමාජිකත්වය ශ්‍රී ලංකාව දරනු ලබයි.

1.2. රබර් වගාව

වාණිජ රබර් වගාවක් යනු වසර 30කට ආසන්න කාලයක් දක්වා දිවෙන දිගුකාලීන ආයෝජනයකි. ශ්‍රී ලංකාවේ තෙත් කලාපය කේන්ද්‍ර කර ගෙන වාණිජ රබර් වගාව කෑගල්ල, ගම්පහ, මාතලේ, මහනුවර, කළුතර, රත්නපුර, කොළඹ, කුරුණෑගල, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්කවල වැඩි වශයෙන් ව්‍යාප්තව පවතින අතර මොනරාගල, බදුල්ල, වව්නියාව, අනුරාධපුර, අම්පාර හා හම්බන්තොට වැනි සාම්ප්‍රදායිකව රබර් වගා නොකළ වියළි හා අතරමැදි කලාපවල ද මේ වනවිට රජයේ මැදිහත්වීමෙන් රබර් වගාව ව්‍යාප්ත කර ඇත. රබර් ශාකය සාර්ථකව වැඩීමටත්, එමඟින් අස්වැන්න වැඩියෙන් ලබා ගැනීමටත් පහත සඳහන් භෞතික හා පාරිසරික සාධක ඉවහල් වේ.

- ✓ 1650 - 3000mm වාර්ෂික වර්ෂාපතනය
- ✓ $28C^0$ පමණ සාමාන්‍ය උෂ්ණත්වය
- ✓ 0 - 500m අතර ජලය බැස යන මඳ බෑවුම් සහිත උස්බිම් ප්‍රදේශ,

ආදි සාධක ඒ සඳහා අත්‍යවශ්‍යවේ. රබර් ශාකයේ ගුණාත්මක වර්ධනය සඳහා නයිට්‍රජන්(N), පොස්පරස්(P), පොටෑසියම් (K), මැග්නිසියම් (Mg) යන ප්‍රධාන පෝෂක පසේ අන්තර්ගත විය යුතුය. රබර් ශාකයට අදාළ වර්ධනීය අවධි ත්‍රිත්වයක් පවතී. එනම්,

- තවාන් අවධිය
- අපරිණත අවධිය
- පරිණත අවධිය වශයෙනි.

සාමාන්‍ය වාණිජ රබර් වගාවකදී ඉහළ අස්වැන්නක් ලබා ගැනීම සඳහා හෙක්ටයාරයක වගා කළ යුතු රබර් පැළ සංඛ්‍යාව 510-520 ත් අතර වේ. රබර් පැළ රෝපණය කිරීමෙන් පසු මුල සිටම රබර් වගාව ඵලදායි ලෙසින් නඩත්තු කිරීම මඟින් වසර 6-7 අතර කාලයක් ගතවීමෙන් පසුව කිරි කැපීම ආරම්භ කළ හැකිය. උදෑසන 3-6ත් අතර රබර් කට්ටියක කිරි කැපීම වඩා සුදුසු බව විද්‍යානුකූලව නිර්දේශ කර ඇත. දවසක් හැර දවසක් වශයෙන් කිරි කැපීම සිදු කිරීම වඩා වැඩි අස්වැන්නක් ලැබීමට හේතු වෙයි.එලෙස කිරි කැපීමෙන් වසර 24කට අධික කාලයක් කිරි අස්වැන්න අඛණ්ඩව ලබා ගැනීමට අවස්ථාව උදාවෙයි. සෑම වසරකම වර්ෂා කාලයේදි කිරි කැපීම යම් පමණ අඩාල වීමක් අතීතයේ දී සිදුවුවත් තාක්ෂණික දියුණුවත් සමඟ වැසි ආවරණ හඳුන්වා දීම තුළින් වර්තමානය වන විට සාමාන්‍ය වර්ෂා කාලවල වුවද බාධාවන් අවම කර ගනිමින් රබර් කිරි අස්වැන්න ලබා ගැනීමට හැකියාව ලැබී ඇත.

1.3. ආයතනයේ ප්‍රධාන කාර්යයන්

1.3.1. ප්‍රධාන කාර්යාලයේ කාර්යයන්

- ප්‍රධාන පනත් හා නෛතික මූලාශ්‍ර මගින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.
- නැවත වගා සහ නව වගා සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම හා ප්‍රාදේශීය කාර්යාල මගින් සහනාධාර ලබාදීම අධීක්ෂණය කිරීම.
- රජයේ තවාන් මගින් උසස් වර්ගයේ බද්ධ රබර් පැළ නිෂ්පාදනය කිරීම.
- රබර් වගාව හා වෙළඳාම සඳහා බලපත්‍ර ලබා දීම.
- කුඩා වතු හා වැවිලි අංශය සඳහා රබර් වගා සහනාධාර ලබා දීම.
- රබර් වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය, දේශීය පරිභෝජනය, අපනයනය හා ආනයනය යනාදී වැදගත් දත්ත හා තොරතුරු යාවත්කාලීන කර පවත්වා ගැනීම.
- රබර් වෙළඳපල පිළිබඳව කුඩා රබර් වතු හිමියන් දැනුවත් කිරීම.
- ස්වභාවික රබර් නිෂ්පාදනය, පරිභෝජනය හා වෙළඳාම සම්බන්ධව අන්තර්ජාතික සංවිධාන සමඟ කටයුතු කිරීම.
- සෙස් අරමුදල් එකතු කිරීම හා පරිපාලනය.
- රබර් වගාවේ හා නිෂ්පාදනයේ ඒ ඒ අවධිවලට අදාලව කුඩා ඉඩම් හිමියන් වෙත අවශ්‍ය දැනුම හා උපදෙස් ලබා දීම.
- කුඩා ඉඩම් හිමියාගේ ආර්ථික උන්නතිය උදෙසා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රබර් අංශයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා ප්‍රමුඛ ආයතනය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම හා එක්රැස් කිරීම.
- ප්‍රාදේශීය කාර්යාල අධීක්ෂණය කිරීම.


1.3.2. ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන කාර්යයන්

- රබර් වගාව සඳහා බලපත්‍ර ලබා දීම හා ඉඩම් ලියාපදිංචි කිරීම.
- රබර් නැවත වගාව හා නව වගාව සිදු කිරීම.
- වගාකරුවන් සඳහා වගා සහනාධාර ලබා දීම ඇතුළු අනෙකුත් සේවා ලබාදීම.
- රබර් වෙළඳ හිමියන් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීම.
- රජයේ රබර් පැළ තවාන් පවත්වාගෙන යාම, රබර් පැළ බෙදා හැරීම හා පුද්ගලික පැළ තවාන් අධීක්ෂණය.
- ගොවීන් හා වතු හිමියන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- රබර් වගාවට වැළඳෙන රෝග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය දැනුවත් කර රෝග පාලනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රබර් වගා හිමියන්ගේ ආර්ථික ශක්තිය නගා සිටුවීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.


1.3.3. රබර් පැල තවාන්වල කාර්යයන්

- රබර් පර්යේෂණායතනයේ නිර්දේශ මත නැවත වගාව හා නව වගාව සඳහා අවශ්‍ය ප්‍රමිතියෙන් උසස් බද්ධ රබර් පැළ නිෂ්පාදනය කිරීම.
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නව ක්ලෝන සොයා ගැනීම් වලට අනුව වැඩි දියුණු කරන ලද ප්‍රභේද ගොවීන්ට හඳුන්වා දීම.
- අවශ්‍ය අවස්ථාවලදී වැවිලි සමාගම් වල පැල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම.
- රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ වගාවන් සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

1.4. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය


අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ප්‍රධාන ගණකාධිකාරි
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (ඇලෙයුම්)
අධ්‍යක්ෂ (මානව)
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ (ප්‍රාදේශීය කාර්යාල 5
ගණකාධිකාරි
ස.අධ්‍යක්ෂ (සංවර්ධන)
ස.අධ්‍යක්ෂ (මානව)
ස.අධ්‍යක්ෂ (පාලන)
ස.අධ්‍යක්ෂ
නි. අධ්‍යක්ෂ (මානව)
නි.අධ්‍යක්ෂ (ඇලෙයුම්)
නි. අධ්‍යක්ෂ (පාලන)
ජෙ.ම.නි. ර.ඝ.නි.
නිති නිලධාරි
පරිපාලන නිලධාරි
පරිපාලන නිලධාරි
ඝ.නි./ කා.ඉ.නි.
ඝ.නි./ කා.ඉ.නි.
ඝ.නි./ කා.ඉ.නි.

1.5 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය



1.6. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

අනු අංකය	තනතුර	අනුමත ප්‍රමාණය	දැනට සිටින ප්‍රමාණය	පුරප්පාඩු ප්‍රමාණය	අතිරික්ත ප්‍රමාණය	වැඩ බලන ප්‍රමාණය
01	අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ- විශේෂ ශ්‍රේණිය)	1	1	0	0	0
02	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ - විශේෂ ශ්‍රේණිය)	1	1	0	0	0
03	අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ -I ශ්‍රේණිය)	7	5	2	0	2
04	අධ්‍යක්ෂ(ශ්‍රී ලං.ක්‍ර.සේ.-I ශ්‍රේණිය)	1	1	0	0	0
05	අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)	1	0	1	0	0
06	ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ- I ශ්‍රේණිය)	1	1	0	0	0
07	ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී ලං. ග. සේ.- I ශ්‍රේණිය)	1	1	0	0	0
08	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ- II , III ශ්‍රේණිය)	12	7	5	0	0
09	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ - II , III ශ්‍රේණිය)	1	1	0	0	0
10	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)	1	0	1	0	0
11	නීති නිලධාරි (දෙපාර්තමේන්තුගත)	1	0	1	0	0
12	ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ - II , III ශ්‍රේණිය)	6	3	3	0	0
13	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී ලං.තො. හා සන්.තා.සේ- II ශ්‍රේණිය)	1	1	0	0	0
14	සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ III)	2	1	1	0	0
15	පරිපාලන නිලධාරි (රා.ක.ස.සේ.- විශේෂ)	4	2	2	0	0
16	ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරි - ව්‍යාප්ති (දෙපාර්තමේන්තුගත-අධි ශ්‍රේණිය)	17	6	11	0	0
17	භාෂා පරිවර්තක - සිංහල/දෙමළ (භා. ප. සේ)	1	0	1	0	0
18	තොරතුරු තාක්ෂණ නිලධාරි (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	2	0	2	0	0
19	තොරතුරු තාක්ෂණ සහකාර (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	5	2	3	0	0
20	සංවර්ධන නිලධාරි (සං. නි. සේ)	22	23	0	1	0
21	ලිපිකරු/යතුරු ලේඛක (දෙපාර්තුමේන්තුගත)	8	2	6	0	0

22	තවාන් කළමණාකරු (දෙපාර්තුමේන්තුගත)	2	2	0	0	5
23	ගොඩනැගිලි නඩත්තු නිළධාරි (දෙපාර්තුමේන්තුගත)	1	1	0	0	0
24	රාජ්‍ය කළමණාකාර සහකාර (රා.ක.ස.)	120	116	4	0	0
25	කළමණාකාර සහකාර (ක.ස.)	8	7	1	0	0
26	රබර් සංවර්ධන නිලධාරි (දෙපාර්තුමේන්තුගත)	170	120	50	0	0
27	රියදුරු (රි.සේ.)	40	26	14	0	0
28	රියදුරු (දෙපාර්තුමේන්තුගත)	1	0	1	0	0
29	ලොරි සහයක (දෙපාර්තුමේන්තුගත)	10	10	0	0	0
30	කාර්යාල කාර්ය සහයක (කා.කා.ස.)	33	29	4	0	0
	එකතුව	481	369	113	1	7*

*මෙම නිලධාරින් අදාළ තනතුරුවල පුර්ණ කාලීනව වැඩ බැලීමේ රාජකාරි ඉටු කරනු ලැබේ.

වගු අංක I

2. දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්හි ප්‍රගතිය

ශ්‍රී ලංකාව තුළ රබර් වගාව ව්‍යාප්ත කිරීම මඟින් විදේශ විනිමය රට තුළට ගලා ඒම වැඩි කිරීමේ අරමුණ ළඟා කර ගැනීම උදෙසා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2021 වර්ෂයේ දී පුළුල් අයුරින් සිය වැඩසටහන් වැඩි දියුණු කර ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව පහත සඳහන් වැඩසටහන් මූලික වශයෙන් ක්‍රියාත්මක කර ඇත.

1. **රබර් නැවත වගා කිරීමේ වැඩසටහන - (කුඩා වතු/ වැවිලි සමාගම්)**
2. **රබර් නව වගාකිරීමේ වැඩසටහන (කුඩා වතු)**
3. **රබර් පැළ නිෂ්පාදනය (රජයේ තවාන් / පෞද්ගලික පැළ තවාන්)**
4. **වැසි ආවරණ යෙදීමේ වැඩසටහන - (කුඩා වතු / වැවිලි සමාගම්)**
5. **අතුරු භෝග වගා වැඩසටහන**
6. **රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන්**
7. **2021 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති**
8. **එක් දින වියළුම් කුටීර ඉදි කිරීම හා යන්ත්‍රෝපකරණ බෙදා දීමේ වැඩසටහන**

2.1. රබර් නැවත වගාව

දැනට වගා කර අස්වනු ලබා ගන්නා පරිණත රබර් ගස් ගලවා ඉවත් කර, අලුත් රබර් පැළ නැවත වගා කිරීමේ අවශ්‍යතාවය රබර් ශාකයක් ක්ෂේත්‍රයේ ස්ථාපනය කර වසර 30 කට ආසන්න කාලයක් ගත වන විට ඇති වේ. එසේ වන්නේ රබර් ඉඩම්හි පවතින රබර් ශාක වයස්ගත වීම, වගා කර ඇති ශාකවල කිරි අස්වැන්න පහළ යාම, එම රබර් කිරිවල ගුණාත්මක මට්ටම නිර්දේශිත මට්ටමින් පහළ මට්ටමක පැවතීම, භූමිය ආන්තික වීම වැනි කරුණු හේතුවෙනි. රබර් නැවත වගාව සඳහා ගොවීන් නැඹුරු කරලීමට අභිප්‍රේරණයක් වශයෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කුඩා වතු හිමියන්ට සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත නැවත වගා සහනාධාර ලබා දෙනු ලැබේ. ඒ අනුව නැවත වගා කරනු ලබන ඉඩම් හෙක්ටයාර් එකක් සඳහා රු. 350,000 ක් බැගින් වගා සහනාධාර ලබා දේ.



රබර් නැවත වගාව සිදු කළ ඉඩමක්

2.1.1. රබර් නැවත වගාව- කුඩා වතු අංශය

2021 වසර සඳහා කුඩා වතු අංශයේ හෙක්. 500 ක් වූ රබර් නැවත වගා ඉලක්ක අනුව දෙපාර්තමේන්තුව අත් කර ගෙන ඇති භෞතික ප්‍රගතියට අදාළ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

කුඩා වතු අංශය විසින් රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය -2021


දිස්ත්‍රික්කය	ඉලක්කය (හෙක්.)	ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව	අයදුම් පත්‍රවලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්.)	නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව	බලපත්‍ර නිකුත් කළ බිම් ප්‍රමාණය (හෙක්.)	නැවත වගාව සිදු කළ බලපත්‍රලාභීන් සංඛ්‍යාව	නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
රත්නපුර	70	152	120.43	140	115.24	102	71.50
කොළඹ	30	63	47.67	52	43.06	41	35.08
මොනරාගල	5	11	8.38	8	5.71	7	5.09
බදුල්ල	5	3	12.24	3	12.24	3	7.11
ගාල්ල	15	6	12.95	6	12.95	3	3.04
මාතර	20	27	24.35	27	24.35	11	10.20
කෑගල්ල	210	651	447.56	553	370.19	410	261.54
ගම්පහ	15	43	36.62	39	30.58	30	25.44
කුරුණෑගල	20	43	45.94	34	38.19	29	27.45
මහනුවර	5	39	22.43	35	19.19	21	11.70
මාතලේ	5	6	18.38	5	18.76	6	9.64
කළුතර	100	205	193.00	166	163.12	113	92.17
එකතුව	**500**	**1,249**	**989.95**	**1,068**	**853.58**	**776**	**559.95**

වගු අංක II

2021 වර්ෂයේ දී කුඩා වතු අංශයේ රබර් වගාකරුවන් නැවත වගාව සඳහා 1,249 ක අයදුම්පත්‍ර ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ අතර ඉන් අයදුම්පත්‍ර 1068 ක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇත. එම බලපත්‍ර යටතේ බලපත්‍රලාභීන් 776 දෙනෙකු විසින් හෙක්. 559.95 ක භූමි ප්‍රමාණයක රබර් නැවත වගාව සිදු කර ඇත. 2021 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ රබර් නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර් 500 ක් වශයෙන් පැවතියදී, එම වසරේ වගාකළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 560ට ආසන්න වීම සාධනීය ලක්ෂණයකි. එනම්, එය ඉලක්කය හා සසඳන විට 112%ක ප්‍රගතියක් අත්කර ගැනීමකි.

කුඩා වතු අංශය විසින් රබර් නැවත වගාව සිදු කළ ආකාරය දිස්ත්‍රික්ක අනුව පහත පරිදි වේ.

කුඩා වතු අංශය විසින් රබර් නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)–2021



ප්‍රස්තාර අංක I

ඉහත ප්‍රස්තාරයට අනුව 2021 වර්ෂයේ දී අනෙකුත් දිස්ත්‍රික්ක අභිබවමින් කෑගල්ල, කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල වැඩි වශයෙන් රබර් නැවත වගාව සිදු කර ඇති බව පැහැදිලි වේ.මෙම වසරේ දී සිදු කරන ලද රබර් නැවත වගාව සඳහා කුඩා වතු අංශය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.මි.36.9ක් සහනාධාර වශයෙන් ලබා දී ඇත.

2.1.2. රබර් නැවත වගාව -වැවිලි අංශය

වාණිජ වශයෙන් ක්‍රියාත්මක වැවිලි සමාගම් විසින් 2021 වසරේ දී රබර් සංවර්ධන දෙපාර්තමේන්තු සහනාධාර යටතේ සිදු කරනු ලැබූ රබර් නැවත වගාව පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

රබර් නැවත වගාව වැවිලි සමාගම් - 2021

වතු සමාගම්	ලැබුණු ඉල්ලුම්පත් අනුව බිම් ප්‍රමාණය	බලපත්‍ර නිකුත් කළ බිම් ප්‍රමාණය (හෙක්.)	නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
පුස්සැල්ලාව වැවිලි සමාගම	343.43	263.38	213.05
නමුණුකුල වැවිලි සමාගම	172.82	134.67	4.98
අගලවත්ත වැවිලි සමාගම	513.80	361.51	289.35
කොටගල වැවිලි සමාගම	24.00	23.89	8.87
හපුගස්තැන්න වැවිලි සමාගම	14.10	14.10	14.10
ඇල්පිටිය වැවිලි සමාගම	48.19	27.95	24.92
බලංගොඩ වැවිලි සමාගම	41.09	10.47	-
ලලාන් වැවිලි සමාගම	175.00	167.96	167.96
කෑගල්ල වැවිලි සමාගම	291.50	127.34	120.38
කැලණිවැලි වැවිලි සමාගම	141.36	44.40	12.00
මල්වත්තවැලි වැවිලි සමාගම	50.24	50.24	50.24
හොරණ වැවිලි සමාගම	24.09	-	-
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	17.50	17.50	-
ඇල්කඩුව වැවිලි සමාගම	29.45	23.24	-
එකතුව	**1886.57**	**1266.65**	**905.85***

*දෙපාර්තමේන්තු සහනාධාර යටතේ පමණක් නැවත වගා කළ බිම් ප්‍රමාණය

වගු අංක III

ඉහත වගුවට අනුව 2021 වර්ෂයේදී අගලවත්ත වැවිලි සමාගම, පුස්සැල්ලාව වැවිලි සමාගම හා ලලාන් වැවිලි සමාගම යන සමාගම් අනෙකුත් වැවිලි සමාගම්වලට සාපේක්ෂව වැඩි වශයෙන් රබර් නැවත වගාව සිදු කර ඇත. වැවිලි සමාගම් අතරින් 2021 වසරේ දී රබර් නැවත වගා කළ භූමි ප්‍රමාණයට 32% ක දායකත්වයක් දක්වමින් අනෙකුත් වැවිලි සමාගම් අභිබවා අගලවත්ත වැවිලි සමාගම පෙරමුණට පැමිණීම කැපී පෙනේ.

2021 වසර සඳහා වැවිලි සමාගම් අංශයේ රබර් නැවත වගා ඉලක්කය හෙක්. 1000ක් වුවද, රබර් නැවත වගාව සඳහා වැවිලි සමාගම් වෙත හෙක්. 1,266.65 ක බිම් ප්‍රමාණයක් සඳහා බලපත්‍ර නිකුත් කොට ඇත. ඉන් 2021 වසරේ වැවිලි සමාගම් විසින් වගා කර ඇති බිම් ප්‍රමාණය හෙක්.905.85කි. වැවිලි සමාගම් රබර් නැවත වගාව තුළින් 91% ක භෞතික ප්‍රගතියක් අත් කර ගැනීමට සමත්ව ඇත. දෙපාර්තමේන්තුව විසින් වැවිලි සමාගම් වෙත රබර් නැවත වගාව සඳහා රු.මි 55.23ක සහනාධාර ලබා දී ඇත.

දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ 2021 වර්ෂයේ දී කුඩා වතු අංශය හා වැවිලි සමාගම් අංශය මඟින් සිදු කළ යුතු සමස්ත රබර් නැවත වගා ඉලක්කය හෙක්. 1,500 ක් වූ අතර නැවත වගාව හෙක්. 1,466ක සමස්ත භූමි ප්‍රමාණයක සිදු කර ඇත.

රබර් නැවත වගා බිම් ප්‍රමාණය (2012– 2021)

(හෙක්ටයාර්)

වර්ෂය	කුඩාවතු	වැවිලි සමාගම්	එකතුව
2012	1,117	2,126	3,243
2013	1,710	2,784	4,494
2014	1,343	1,554	2,897
2015	614	1,303	1,917
2016	538	1,048	1,586
2017	787	400	1,187
2018	525	336	861
2019	578	462	1,040
2020	457	555	1,012
2021	560	906	1,466

වගු අංක IV

2021 වසරේ සමස්ත රබර් නැවත වගා කළ භූමි ප්‍රමාණය 2020 වසරේ වගා කළ භූමි ප්‍රමාණයට සාපේක්ෂව ව වැඩි අගයක් ගනු ලබන අතර වැවිලි සමාගම් අංශයෙන් 2021 වසරේදී රබර් නැවත වගා කළ භූමි ප්‍රමාණය 2020 වසරට සාපේක්ෂව දෙගුණයට ආසන්න අගයක් ගැනීම ප්‍රශංසනීය තත්ත්වයකි.

2.2. රබර් නව වගාව

කාර්මික අමුද්‍රව්‍යයක් වන ස්වභාවික රබර් සඳහා වන ඉල්ලුම දිනෙන් දින ලෝක වෙළඳපොළ තුළ ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවති. එම තත්ත්වය තුළ ශ්‍රී ලංකාව මඟින් සිදු කරන රබර් අපනයනය වැඩි කිරීමට දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා රබර් නව වගාව ව්‍යාප්ත කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරයි. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව කුඩා වතු අංශය සඳහා පමණක් රබර් නව වගාකරුවන් සඳහා හෙක්ටයාරයකට රු.300,000 බැගින් වන සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කරන අතර අවශ්‍ය උපදේශන සහාය ද ලබා දෙයි. රබර් නිෂ්පාදනය වර්ධනය කිරීම හරහා ආර්ථික සංවර්ධනයට දායක වීම දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථය වී ඇත. නව රැකියා උත්පාදනය කිරීම

තුළින් කුටුම්භ ආදායම් ඉහළ නැංවීම, විශේෂයෙන්ම ශ්‍රම බලකායට අයත් රැකියා විරහිතව සිටින අයට ආදායම් ඉපැයීමට අවස්ථාව සැලසීම,වගා නොකරන ඉඩම් වගා කටයුතු සඳහා යොදා ගැනීම සහ ස්වාභාවික පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා වන ආවරණ වැඩි කිරීම තුළින් වගාවේ තිරසාරභාවය ආරක්ෂා කිරීම නව වගාවේ සෙසු අරමුණු වේ.

2.2.1. රබර් නව වගාව -කුඩා වතු අංශය

2021 වර්ෂයට අදාළව කුඩා වතු අංශයේ රබර් නව වගාව සම්බන්ධ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.


දෙපාර්තමේන්තුවේ සහනාධාර යටතේ රබර් නව වගා කළ බිම් ප්‍රමාණය - 2021 (කුඩාවතු)

දිස්ත්‍රික්කය	ඉලක්කය	ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	අයදුම් පත්‍රවලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්.)	නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව	බලපත්‍ර නිකුත් කළ බිම් ප්‍රමාණය (හෙක්.)	නව වගාව අවසන් කළ බලපත්‍රලාභීන් සංඛ්‍යාව	නව වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
රත්නපුර	25	84	53.01	80	49.61	55	32.26
කොළඹ	10	34	20.37	25	16.89	14	7.74
මොනරාගල	175	353	202.18	325	188.23	297	163.67
බදුල්ල	25	34	18.82	29	16.78	26	13.58
අම්පාර	15	4	1.62	4	1.62	3	1.21
ගාල්ල	10	15	20.29	15	20.29	10	11.85
මාතර	10	29	29.06	29	29.06	19	15.00
හම්බන්තොට	20	29	13.96	29	13.96	21	9.06
කෑගල්ල	35	224	96.51	177	90.46	137	55.59
ගම්පහ	10	24	18.77	21	14.95	12	8.26
කුරුණෑගල	15	25	13.30	24	13.79	19	9.39
මහනුවර	5	21	9.40	16	5.86	12	5.01
මාතලේ	25	23	20.24	23	20.24	9	8.70
අනුරාධපුරය	5	46	32.70	45	29.25	12	6.20
කළුතර	15	64	31.04	55	27.92	39	16.18
එකතුව	**400**	**1009**	**581.27**	**897**	**538.91**	**685**	**363.69**

වගු අංක V

ඉහත තොරතුරුවලට අනුව 2021 වසරේ දී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හෙක්. 400 ක රබර් නව වගාව සිදු කිරීමට ඉලක්ක කොට තිබූ අතර, කුඩා වතු අංශය විසින් හෙක්.363.69 ක ද, ඊට අමතරව රජයේ තවාන් මගින් සිදු කරන ලද හෙක්. 2 ක ආදර්ශ රබර් වගාව ද, ඇතුළත්ව වසරේ සමස්ත කුඩා වතු අංශයේ රබර් නව වගා භූමි ප්‍රමාණය හෙක්. 365.69ක් වේ. එසේම වැවිලි සමාගම් විසින් ද හෙක්. 2 ක රබර් නව වගාව සිදු කර ඇත.ඒ අනුව 2021 වසරේ දී රබර් නව වගාව තුළින් 91% ක භෞතික ප්‍රගතියක් වෙත ළඟා වීමට හැකි වූ අතර, ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.මි. 21.49ක වැයක් දරා ඇත. මෙම වසරේ දී කුඩා වතු අංශය මඟින් දිස්ත්‍රික්ක 15 ක රබර් නව වගාව සිදු කර ඇත.

2021 රබර් නව වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) - කුඩා වතු



ප්‍රස්තාර අංක II

ඉහත ප්‍රස්තාරයට අනුව 2021 වසරේ දී මොනරාගල, කෑගල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක තුළ රබර් නව වගාව වැඩි වශයෙන් සිදු කර ඇති අතර අනෙකුත් දිස්ත්‍රික්ක අභිබවමින් මොනරාගල දිස්ත්‍රික්කය රබර් නව වගාව තුළ ප්‍රමුඛස්ථානය හිමි කර ගෙන ඇත. මේ තුළින් මොනරාගල දිස්ත්‍රික්කයේ වගාකරුවන් වැවිලි බෝගයක් ලෙස රබර් වගාව තෝරා ගැනීමේ ඉහළ ප්‍රවණතාවක් පවතින බව දෘෂ්‍යමාන වේ. එමෙන්ම කෑගල්ල, ගාල්ල, මාතර, අනුරාධපුරය, කළුතර, මහනුවර සහ රත්නපුර දිස්ත්‍රික්ක තම වාර්ෂික ඉලක්කය ඉක්මවමින් රබර් නව වගාව සිදු කර ඇත.

2015 වර්ෂයේ සිට මේ දක්වා දෙපාර්තමේන්තු සහනාධාර යටතේ වාර්ෂික නව වගා බිම් ප්‍රමාණයට ඉහළ දායකත්වයක් සැපයූ දිස්ත්‍රික්ක පහත පරිදි වේ.

වර්ෂය	දිස්ත්‍රික්කය	දිස්ත්‍රික්කයේ නව වගාව සිදු කළ බිම් ප්‍රමාණය(හෙක්.)	ශ්‍රී ලංකාවේ රබර් නව වගාව සිදු කළ මුළු බිම් ප්‍රමාණය
2015	අම්පාර	400	825
2016	අම්පාර	268	615
2017	මොනරාගල	417	1,035
2018	මොනරාගල	565	1,029
2019	මොනරාගල	662	1,103
2020	මොනරාගල	397	751
2021	මොනරාගල	539	1,188

වගු අංක VI

ඉහත තොරතුරු අනුව 2017 වසරේ පටන් රබර් නව වගාවට ඉහළ දායකත්වයක් දක්වා ඇත්තේ මොනරාගල දිස්ත්‍රික්කය වීම සුවිශේෂී තත්ත්වයකි. වාර්ෂික මහ බැංකු වාර්තා අනුව ශ්‍රී ලංකාව තුළ ඒක පුද්ගල ආදායම අවම අගයක් ගනු ලබන දිස්ත්‍රික්කයක් වශයෙන් හඳුනාගන්නා මොනරාගල දිස්ත්‍රික්කයේ වැවිලිකරුවන් මෙම රබර් වගාව වෙත යොමු වීම සුවිශේෂී කරුණකි.

සාම්ප්‍රදායික නොවන දිස්ත්‍රික්ක ආශ්‍රිත නව වගාව යටතේ රබර් නව වගා බිම් ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවක් පවතී. ඒ අනුව වියළි කලාපීය දිස්ත්‍රික්ක වන වව්නියාව, අනුරාධපුරය හා මාතලේ දිස්ත්‍රික්කවල රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශේෂ අධීක්ෂණය යටතේ කුඩා වතු හිමියෝ රබර් නව වගාවන් සිදු කරති. අනුරාධපුරය එප්පාවල ඉපලෝගම ප්‍රදේශයේ අක්කර 1ක බිම් ප්‍රමාණයක සාර්ථක රබර් නව වගාවක් පවත්වාගෙන යන අතර කිරි කැපීම ද මේ වනවිට ආරම්භ කර ඇත. එසේම වව්නියාව දිස්ත්‍රික්කයේ අක්කර 9.5ක බිම් ප්‍රමාණයක් නව වගාව සිදු කර ඇත. අනුරාධපුරය තලාව ප්‍රදේශයේ ඇති අක්කර 3ක පමණ රබර් නව වගාව අපරිණත අවදියක පැවතියත්,දැනට සාර්ථක ශාක වර්ධනයක් පෙන්නුම් කරන අතර කිරි කැපීමට ආසන්නව පවතී.

මාතලේ විල්ගමුව මොරගහඋල්පත ප්‍රදේශයේ අක්කර 20ක බිම් ප්‍රමාණයක් වගාකරුවන් 34 දෙනෙකු විසින් නව වගාව යටතේ රබර් වගාවක් ආරම්භ කර ඇත. වියළි කලාපීය ප්‍රදේශයක් වන එම ප්‍රදේශයේ ද සාර්ථක ලෙස වගාව පවත්වාගෙන යමින් පවතී.



අනුරාධපුර තලාව ප්‍රදේශයේ කිරි කැපීමට සුදානම්ව පවතින රබර් වගාවක්



මාතලේ විල්ගමුව ප්‍රදේශයේ රබර් වගාවක්



අනුරාධපුර ඉපලෝගම කිරි අස්වනු නෙළන රබර් වගාවක්

2.2.2. රබර් නව වගාව - කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (Smallholder Tea and Rubber Revitalization Project (STaRR)

ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ අරමුණින් කෘෂිකර්මාන්තය සඳහා වන අන්තර්ජාතික අරමුදලේ (IFAD) හා ශ්‍රී ලංකා රජයේ මුල්‍ය දායකත්වය යටතේ 2016 දී **කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය** ආරම්භ කර ඇත. එය මාතර, ගාල්ල, රත්නපුර, නුවරඑළිය, මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්ක තුළ තේ වගාව ද මොනරාගල හා අම්පාර දිස්ත්‍රික්ක දෙක තුළ රබර් වගාව ද ව්‍යාප්ත කිරීම සඳහා ක්‍රියාත්මක වේ. වැවිලි ක්ෂේත්‍රයට මෙය දිගු කාලීන ආයෝජන අවස්ථාවකි.

මොනරාගල හා අම්පාර දිස්ත්‍රික්ක වැනි සාම්ප්‍රදායිකව රබර් වගා නොකරන ප්‍රදේශවල වගාකරුවන්ට නව වගාව සඳහා සහනාධාර ලබාදීමත්, රජයේ පැළ තවානක් වන පදියතලාව රබර්

පැළ තවානේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මූල්‍ය ආධාර ලබාදීමත්, කුඩා තේ හා රබර් වතුවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මූල්‍ය ආධාර ලබාදීමත් තුළින් මෙම ව්‍යාපෘතිය රබර් අංශයේ උන්නතිය සඳහා දායක වී ඇත. රබර් පර්යේෂණ ආයතනය මගින් ව්‍යාපෘතිය සඳහා අවැසි විද්‍යානුකූල තාක්ෂණික සහය සපයන අතර 2016 – 2022 දක්වා ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය තුළ ව්‍යාපෘති කළමණාකාරිත්වය හා ප්‍රතිලාභීන් අතර සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවීම සහ අනෙකුත් තාක්ෂණික හා සේවා සහාය ලබා දීම උදෙසා රබර් සංවර්ධන දෙපාර්තුමේන්තුව මැදිහත්ව කටයුතු කරනු ලබයි.

කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ වාර්තාවලට අනුව අම්පාර හා මොනරාගල දිස්ත්‍රික්කවල 2016 සිට 2021 දක්වා වාර්ෂිකව රබර් නව වගාව සිදු කළ ආකාරය පහතින් දක්වා ඇත. මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ආරම්භ කළ අතර එම වර්ෂයේ පටන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මොනරාගල ප්‍රාදේශීය කාර්යාලය මගින් රබර් වගාව අධීක්ෂණය කරනු ලැබූ අතර අදාළ වැයබර දරන ලද්දේ ව්‍යාපෘතිය මගිනි.

වර්ෂය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)		වැය කළ මුදල (රු.මි.)		වගා කරන ලද ගොවීන් සංඛ්‍යාව	
	අම්පාර	මොනරාගල	අම්පාර	මොනරාගල	අම්පාර	මොනරාගල
2016	55	197	-	16.00	71	327
2017	7	315	-	11.60	11	561
2018	224	407	7.92	64.91	380	725
2019	317	573	62.80	96.33	465	1,023
2020	196	333	118.06	268.67	344	652
2021	447	375	139.81	126.07	756	649
2022 ඉලක්කය	-	-	*26.11	*18.37	-	-

*2021 සිදු කරන ලද ක්‍රියාකාරකම්වල ඇති ඉතිරි ගෙවීම් හා පාළු පැළ සිටුවීම සඳහා අදාළ ගෙවීම.

වගු අංක VII

2012 වසර සිට 2021 වසර දක්වා සියළුම අංශවල දායකත්වය ඇති ව ශ්‍රී ලංකාවේ රබර් නව වගාව සිදු කළ මුළු බිම් ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇත.

රබර් නව වගා බිම් ප්‍රමාණය 2012 – 2021(හෙක්.)

වර්ෂය	කුඩා වතු	වැවිලි සමාගම්	එකතුව
2012	2,297	1,086	3,383
2013	2,979	912	3,891
2014	1,428	133	1,561
2015	769	56	825
2016	592	23	615
2017	700	335	1,035
2018	981	48	1,029
2019	1,103	-	1,103
2020	726	25	751
2021	1,186	02	1,188

වගු අංක VIII

2.3. රබර් වගාව සඳහා සහනාධාර ගෙවීම - 2021

දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ සිදු කරන ලද රබර් නැවත වගාව, නව වගාව, වගාව සඳහා වලවල් කැපීම වෙනුවෙන් ගෙවන ලද සහනාධාර මුදල් හා 2021 වසරට පෙර සිදු කරන ලද වගාවන් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් වැය කරන ලද සම්පූර්ණ සහනාධාර මුදල් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

ව්‍යාපෘතිය	රබර් වගාව සඳහා සහනාධාර ගෙවූ මුදල (රු.මි.)		
	2021 වසරේ වගාව සඳහා	**පෙර වර්ෂවල වගාව සඳහා**	**එකතුව**
නැවත වගා සහනාධාර (කුඩා වතු අංශය)	36.98	153.92	**190.9**
නව වගා සහනාධාර (කුඩා වතු අංශය)	21.49	61.36	**82.85**
නැවත වගා සහනාධාර (වැවිලි සමාගම්)	55.23	233.91	**289.14**
වගාව සඳහා වලවල් කැපීම	6.09	0.16	**6.25**
එකතුව	**119.79**	**449.35**	**569.14**

වගු අංක IX

2.4. රබර් පැළ නිෂ්පාදනය

2.4.1. රජයේ පැළ තවාන්

ගුණාත්මක රබර් පැළයක් සෑම විටම සරු අස්වැන්නක් ලබා දෙන අතර, එමගින් වගාකරුවාගේ ආර්ථිකයට මෙන්ම සමස්ත වැවිලි ආර්ථිකයට ද අගනා ප්‍රතිලාභයක් අත් වේ. ඒ අනුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව රබර් වගාකරුවන්ට නිතැතින්ම ගුණාත්මක රබර් පැළ ලබා දීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කර ඇත. එහිදී රබර් පර්යේෂණ ආයතනය හා සම්බන්ධ වෙමින් නිරන්තරයෙන් ඔවුන්ගේ පර්යේෂණ මගින් සොයා ගන්නා නව සොයා ගැනීම් අනුව යාවත්කාලීනව ගුණාත්මක රබර් පැළ නිෂ්පාදනය කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව රබර් පැළ තවාන් 08 ක් පිහිටුවා ඇත.

ගුරුගොඩ, ඇඟල්ඔය, වැලිකඩමුල්ල, මීරිගම, කුඹුක්කන, පදියතලාව, කරපිංච හා මිද්දෙණිය රජයේ පැළ තවාන්වල 2021 වසරේ සිදු කරන ලද රබර් පැළ නිෂ්පාදනය හා පැළ බෙදා හැරීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ පැළ තවාන්හි පැළ නිෂ්පාදනය සහ පැළ බෙදා හැරීම - 2021

තවානේ නම	පැළ නිෂ්පාදන ඉලක්කය	නිෂ්පාදිත පැළ සංඛ්‍යාව	බෙදා හරින ලද පැළ සංඛ්‍යාව
කරපිංච තවාන - රත්නපුර	50,000	154,388	57,805
කුඹුක්කන තවාන - මොනරාගල	350,000	357,146	290,114
පදියතලාව තවාන - මොනරාගල	100,000	72,555	58,545
මිද්දෙණිය තවාන- ගාල්ල	50,000	53,218	42,183
වැලිකඩමුල්ල තවාන- කෑගල්ල	250,000	211,013	197,981
මීරිගම තවාන- කෑගල්ල	100,000	89,082	83,838
ඇඟල්ඔය තවාන-කළුතර	200,000	122,179	125,738
ගුරුගොඩ තවාන- කළුතර	200,000	217,651	216,413
එකතුව	1,300,000	1,277,232	1,072,617

වගු අංක X

ඒ අනුව 2021 වර්ෂයේ පැළ 1,300,000ක නිෂ්පාදන ඉලක්කයක් හමුවේ රබර් පැල 1,277,232ක් සාර්ථකව නිෂ්පාදනය කරමින් 98%ක භෞතික ප්‍රගතියක් වෙත ළඟා වීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත. එසේම නිෂ්පාදිත පැළ 1,277,232න් පැළ 1,072,617 ක් නව වගා හා නැවත වගා සඳහා බෙදා හැර ඇත.

2021 වර්ෂය තුළද වැඩිම පැළ නිෂ්පාදනයක් සිදු කර ඇත්තේ මොනරාගල ප්‍රාදේශිය කාර්යාලය යටතේ ක්‍රියාත්මක කුඹුක්කන පැළ තවාන වන අතර, වැලිකඩමුල්ල හා ගුරුගොඩ තවාන් ද ඉහළ පැළ නිෂ්පාදනයක් සිදු කර ඇත. එම තවාන් ත්‍රිත්වය වාර්ෂික සමස්ත රබර් පැළ නිෂ්පාදනයට පැළ 785,810 ක් එකතු කරමින්, සමස්ත රබර් පැළ නිෂ්පාදනය සඳහා 62% ක දායකත්වයක් ලබාදීමට සමත්ව ඇත. රජයේ පැළ තවාන්හි පැළ නිෂ්පාදන ඉලක්කය මුදුන් පමුණුවා ගැනීම සඳහා වෙන් කරන ලද රු. මි 157.67 කින් රු.මි 150 ක් වැය කර 95% ක මූල්‍ය ප්‍රගතියක් ළඟා කර ගෙන ඇත. පෙර වර්ෂ කිහිපයක රජයේ පැළ තවාන්හි වාර්ෂික පැළ නිෂ්පාදනය පහත වගුවේ දක්වා ඇත.

වර්ෂය	පැළ නිෂ්පාදනය
2015	1,386,593
2016	1,204,748
2017	946,805
2018	1,327,180
2019	1,454,004
2020	1,026,899
2021	1,277,232

වගු අංක XI

2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී පැළ නිෂ්පාදනයේ නැවත වර්ධනයක් පෙන්නුම් කිරීම කැපී පෙනෙන තත්ත්වයකි.



තවාන් කරන ලද බීජ පැළ - ඇඟල් ඔය තවාන



බද්ධ කළ රබර් පැළවලට පොහොර යෙදීම - ගුරුගොඩ තවාන



සාර්ථකව බද්ධ කළ රබර් පැළ - මිද්දෙණිය තවාන



දැල් ගෘහය තුළ සකස් කළ බද්ධ පැළ - පදියතලාව තවාන



බිංදු ජල විසිරන පද්ධතිය මගින් තවාන් පැළ සඳහා ජලය යෙදීම - පදියතලාව තවාන

2.4.2. පෞද්ගලික පැළ තවාන්

ශ්‍රී ලංකාවේ නැවත වගා හා නව වගා සඳහා වාර්ෂික පැළ අවශ්‍යතාවය මුළුමනින්ම සැපයීම රජයේ තවාන් මඟින් සිදු නොවේ. පැළ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේදී පෞද්ගලික තවාන් හිමියන් මෙන්ම වැවිලි සමාගම් ද සැළකිය යුතු දායකත්වයක් සපයති. 2020 හා 2021 වර්ෂවල දිස්ත්‍රික්ක අනුව පෞද්ගලික අංශයේ පැළ නිෂ්පාදනය පහත දැක්වේ.

පැළ නිෂ්පාදනය - 2020/2021 (පෞද්ගලික පැළ තවාන්)

දිස්ත්‍රික්කය	පැළ නිෂ්පාදනය	
	2020	**2021**
රත්නපුර	139,950	201,000
කොළඹ	-	106,500
මොනරාගල	27,277	29,278
ගාල්ල	13,500	13,717
කෑගල්ල	174,640	596,842
ගම්පහ	-	55,500
කළුතර	7,788	114,688
එකතුව	**363,155**	**1,117,525**

වගු අංක XII

2021 වර්ෂයේ පෞද්ගලික පැළ තවාන්හි පැළ නිෂ්පාදනය 1,117,525 ක් වන අතර පසුගිය වසරේ එය 363,155කි. ඒ අනුව සලකා බලන විට 2020 වසරට වඩා පැළ 754,370 ක් 2021 වසරේ නිෂ්පාදනය කිරීමට පෞද්ගලික පැළ තවාන් හිමියන් කටයුතු කිරීම කැපී පෙනෙන වර්ධනයකි. මේ සඳහා වැඩි වශයෙන් බලපා තිබෙන්නේ 2021 වර්ෂයේ රබර් මිලෙහි සිදු වූ වැඩිවීම මත පදනම් ව ගොවීන් විසින් රබර් වගාව සඳහා වැඩි වශයෙන් යොමු වීමෙන් පැළ සඳහා ඇති වූ ඉල්ලුම ඉහළ යාමයි.

පෞද්ගලික අංශයේ පැළ නිෂ්පාදනයේදී කෑගල්ල දිස්ත්‍රික්කය ඉහළම පැළ නිෂ්පාදනය සිදු කර ඇත. එම නිෂ්පාදනය පෞද්ගලික පැළ තවාන්වල සමස්ත පැළ නිෂ්පාදනයෙන් 53% කි. රත්නපුර, කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල ද ඉහළ පැළ නිෂ්පාදනයක් සිදු කර ඇත.

2.5. වැසි ආවරණ යෙදීමේ වැඩසටහන

රබර් වගා කරන සාම්ප්‍රදායික දිස්ත්‍රික්ක සියල්ලම පාහේ අයත් වන්නේ තෙත් කලාපයට වේ. ඒ හේතුවෙන් වසර පුරාම මෝසම් වාසුළි හා සංවහන වර්ෂාවලට වගාව ගොදුරු වේ. තෙත් දේශගුණය රබර් ශාකය වර්ධනය සඳහා හිතකර දේශගුණයක් වුවද, පරිණත රබර් ශාකයකින් සාර්ථක කිරි අස්වැන්නක් ලබා ගැනීමට එය බාධාවකි. වර්ෂා කාලය ආරම්භවෙත්ම කිරි අස්වැන්න නෙළීම නැවැත් වීමට සිදුවීම රබර් වගාකරුවන් මුහුණ දෙන අභියෝගයකි. මෙම අභියෝගයට මුහුණදීමේ අරමුණින් රබර් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වා දී ඇති වැසි ආවරණ යෙදීමේ ක්‍රමය වෙත අද වනවිට කුඩා රබර් වතු හිමියන් මෙන්ම වැවිලි සමාගම් ද යොමුව ඇත. එම ක්‍රමවේදය තුළ සාමාන්‍ය වර්ෂා කාලයේදී බාධාවකින් තොරව කිරි අස්වනු නෙළීමට හැකි වේ. එමගින් වගාකරුවන් ආදායම මෙන්ම දෛනික වැටුපට කිරි කැපීම හා කිරි එකතු කිරීම වැනි කටයුතුවල යෙදෙන බහුතරයක් වන කම්කරු ශ්‍රමිකයන්ගේ ආදායම වැඩි කර ගත හැකි වේ.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසින් වැසි ආවරණ යෙදීමේ ක්‍රමය වගාකරුවන් අතර ප්‍රචලිත කිරීමට සහනාධාර ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව සාර්ථකව වැසි ආවරණ යොදා ඇති කුඩා ඉඩම් හිමියන්ගේ එක් රබර් ගසකට රු. 70/- බැගින් සහනාධාර මුදලක් කුඩා රබර් වතු හිමියන් සඳහා ද ගසකට රු. 35/- ක මුදලක් වැවිලි සමාගම් වෙත ද ගෙවනු ලැබේ.



වැසි ආවරණ යොදන ලද රබර් වගාවක්


2021 වර්ෂයේ කුඩා වතු අංශයට අදාළව වැසි ආවරණ යෙදීම සම්බන්ධ තොරතුරු පහත වගුවේ දැක්වේ.

දිස්ත්‍රික්කය	වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)	වැසි ආවරණ යෙදූ ගස් සංඛ්‍යාව	වැසි ආවරණ යෙදූ ගොවීන් සංඛ්‍යාව	සහනාධාර වශයෙන් ගෙවූ මුදල (රු.මි.)
රත්නපුර	358.04	141,922	257	4.83
කොළඹ	114.13	44,244	60	0.70
බදුල්ල	4.24	1,340	2	0.09
ගාල්ල	11.47	4,592	17	0.32
මාතර	44.82	17,936	74	1.26
හම්බන්තොට	0.20	80	1	0.01
කෑගල්ල	363.76	112,138	210	6.31
ගම්පහ	41.52	14,752	36	0.40
කුරුණෑගල	71.76	23,459	34	1.64
මහනුවර	7.16	2,358	11	0.17
මාතලේ	7.85	2,970	2	0.21
කළුතර	211.54	83,767	144	5.86
එකතුව	**1,236.49**	**449,558**	**848**	**21.78**

වගු අංක XIII

කුඩා වතු අංශය යටතේ 2021 වර්ෂයේදී වැසි ආවරණ හෙක්.1,236.49 බිම් ප්‍රමාණයක රබර් ගස් 449,558 කට යොදන ලදී. එසේ වැසි ආවරණ යෙදූ කුඩා රබර් වතු හිමියන් 848 දෙනෙක් සඳහා රු.මිලියන 21.78 ක මුදලක් සහනාධාර වශයෙන් රජය ලබා දී ඇත.

දිස්ත්‍රික්ක වශයෙන් වැසි ආවරණ යොදන ලද බිම් ප්‍රමාණය - 2021 (කුඩා වතු)



ප්‍රස්තාර අංක III

කුඩා වතු අංශයෙන් වැහි ආවරණ යොදන ලද දිස්ත්‍රික්ක අතරින් වැඩිම වැහි ආවරණ ප්‍රමාණයක් යෙදීම සිදු කර ඇත්තේ කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල ය. එම දිස්ත්‍රික්ක දෙකෙහි

හෙක්.721.8ක බිම් ප්‍රමාණයක් සඳහා වැසි ආවරණ යොදා ඇති අතර එය සමස්ත වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණයෙන් 58% කි.

වැවිලි සමාගම් විසින් 2021 වසරේ දී රබර් වගාව සඳහා වැසි ආවරණ යෙදීම පිළිබඳ තොරතුරු පහත වගුව තුළින් නිරූපණය වේ.

ප්‍රාදේශීය කාර්යාලය	වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)	වැසි ආවරණ යෙදූ ගස් ගණන	සහනාධාර වශයෙන් ගෙවූ මුදල (රු.මි)
රත්නපුර	1,398.37	444,814	15.83
ගාල්ල	199.49	79,855	2.79
කෑගල්ල	1,050.00	464,820	15.69
කළුතර	1,913.57	369,000	12.92
එකතුව	**4,561.43**	**1,358,489**	**47.23**

වගු අංක XIV

වගුව අනුව 2021 වසරේ දී වැවිලි සමාගම් මගින් හෙක්. 4,561.43ක භූමි ප්‍රමාණයක වැසි ආවරණ යෙදීම සිදු කර ඇති අතර ඒ වෙනුවෙන් වැය කරන ලද මුදල රු.මි.47.23 කි.

වැවිලි සමාගම් අංශයේ වැසි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ අනෙකුත් ප්‍රාදේශීය කාර්යාලය අතරින් කෑගල්ල ප්‍රාදේශීය කාර්යාල අධීක්ෂණ බල ප්‍රදේශයේ වැඩිම ගස් ප්‍රමාණයකට වැසි ආවරණ යෙදීම වාර්තා වූ අතර එම බිම් ප්‍රමාණය හෙක්. 1,050 කි. 2015 වසරේ සිට වාර්ෂිකව වැසි ආවරණ යෙදීමේ සමස්ත ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකි වේ.

වැසි ආවරණ යෙදීම 2015 - 2021

වර්ෂය	කුඩා වතු බිම් ප්‍රමාණය (හෙක්.)	වැවිලි සමාගම් බිම් ප්‍රමාණය (හෙක්.)
2015	478.58	3,778.29
2016	182.65	2,452.52
2017	258.88	1,072.79
2018	323.71	1,071.32
2019	434.43	2,454.94
2020	941.70	5,945.77
2021	**1,236.49**	**4,561.43**

වගු අංකXV

2016 වර්ෂයේ පටන් කුඩා වතු අංශයේ වැසි ආවරණ යොදන ලද බිම් ප්‍රමාණය ක්‍රමානුකූල වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර මෙම වසරේදී එය ප්‍රථමවරට හෙක්. 1000 ඉක්මවූ අගයක් ගන්නා ලදී. එසේම වැවිලි සමාගම් අංශයේ වැසි ආවරණ යොදන ලද බිම් ප්‍රමාණය 2015 වසරේ සිට වරින් වර වෙනස් වීම්වලට ලක් වුවද 2019 වසරේ හෙක්.2455 ක් වූ බිම් ප්‍රමාණය 2020 වසරේ

දෙගුණයකට එහා ගිය අගයක් වූ හෙක්. 5947 (ආසන්න වශයෙන් හෙක්.6000) ක් පමණ විය. එසේම 2021 වසරේ වැසි ආවරණ යොදන ලද බිම් ප්‍රමාණය හෙක්.4561 ක් වේ.

2.6. අතුරු භෝග වගාව

රබර් ශාකයේ අස්වැන්න නෙලීම ආරම්භ වන්නේ වසර 6-7 අතර කාලයකට පසුව වන බැවින් වගාකරුවන්ගේ රබර් අස්වැන්නෙන් ආදායම ලැබීම ද එතෙක් ප්‍රමාද වේ. එසේම ඒ අතරතුර කාලය සඳහා රබර් ශාකය නඩත්තු කිරීමට සිදු වන බැවින් වගාකරුවන්ට වියදමක් ද ඒ සඳහා දැරීමට සිදු වේ. මේ තත්ත්වයට යම් ආර්ථික සහනයක් වශයෙන් **අතුරු භෝග වගා ක්‍රමය** හඳුන්වා දී ඇත. ඒ අනුව අන්නාසි, කෙසෙල්, වැල් දොඩම්, ගස්ලබු, කොකෝවා, මිරිස්, ඉඟුරු, පුවක්, කුරුඳු, ලූණු, මුං ඇට, කවුපි, උඳු, තල, කුරක්කන්, එනසාල්, සාදික්කා, ගම්මිරිස්, එළවළු වර්ග, බඩඉරිඟු වැනි වගාවන් මෙහිදී සිදු කෙරේ. 2020-2021 වසරේ රජයේ ආනයන සීමා කිරීමේ ප්‍රතිපත්තිය මත කහ ආනයනය කිරීම තහනම් කළ බැවින්, රබර් වතු ආශ්‍රිතව කහ වගාව ද අතුරු භෝගයක් සේ වගා කිරීමට යොමු වූ අතර, කහ සඳහා පැවති අධික ඉල්ලුම හේතුවන් ඉන් හොඳ ආදායමක් ලැබීමට හැකි විය. අතුරු භෝග වගා ක්‍රමය මඟින් වගාකරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් වන්නා සේම රබර් වගා බිම් ආශ්‍රිත භූමිය තුළ වල් පැළෑටි මර්දනය වීම, ශාක විවිධත්වය තුළ පස ආන්තික තත්ත්වයට පත් නොවීම, භූමිය හා ජලය ඇතුළු ස්වභාවික සහ භෞතික සම්පත් මෙන්ම මානව සම්පත වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස භාවිතා වීම, වගාව පිළිබඳ නිරන්තර අවධානය හා අධික්ෂණය වැඩි වීම හා පළිබෝධ හානි ඉක්මනින් හඳුනා ගැනීමට හැකි වීම ආදි වාසි රැසක් අත් කර ගැනීමට හැකි වේ. රබර් පර්යේෂණායතනයේ නිර්දේශිත ආකාරයට සාර්ථකව වගා කරන ලද අතුරු භෝග සහිත රබර් වගාවක් සඳහා අක්කරයකට රු. 4,000/- ක සහනාධාර මුදලක් දෙපාර්තමේන්තුව මඟින් ගෙවනු ලැබේ.



රබර් වගාවක පවතින අන්නාසි අතුරු භෝග වගාවක්



රබර් වගාවක පවතින කෙසෙල් අතුරු භෝග වගාවක්



රබර් වගාවක පවතින බඩඉරිඟු අතුරු භෝග වගාවක්

2021 වර්ෂයේ අතුරු භෝග වගාව පිළිබඳ තොරතුරු පහත වගුවේ ඇතුළත් වේ.

දිස්ත්‍රික්කය	ඉලක්කය (හෙක්.)	භෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)	වගා කළ ගොවීන් සංඛ්‍යාව
රත්නපුර	45	අන්නාසි	11.62	9
		කෙසෙල්	6.36	10
		එළවළු	0.20	1
		ධාන්‍ය හා වෙනත්	1.62	2
		එකතුව	19.8	22
කොළඹ	20	අන්නාසි	26.35	26
		එළවළු	0.30	1
		එකතුව	26.65	27
මොනරාගල	100	අන්නාසි	0.20	1
		කෙසෙල්	18.94	36
		බඩ ඉරිඟු	12.27	20
		වෙනත්	32.31	53
		එකතුව	63.72	110
බදුල්ල	15	වෙනත්	3.30	5
		එකතුව	3.30	5
ගාල්ල	5	අන්නාසි	0.41	1
		කෙසෙල්	0.41	1
		කන්න භෝග	0.41	1
		එකතුව	1.23	3
මාතර	5	අන්නාසි	0.78	4
		කෙසෙල්	3.26	11
		එකතුව	4.04	15
හම්බන්තොට	10	කෙසෙල්	0.81	2

		කන්න භෝග	6.00	15
		එකතුව	6.81	17
කැගල්ල	100	අන්නාසි	30.39	114
		කෙසෙල්	40.17	
		කහ,මිරිස්,පුවක්	2.01	
		ලූණු,එලවළු	1.10	
		එකතුව	73.67	114
ගම්පහ	10	අන්නාසි	22.97	28
		එකතුව	22.97	28
කුරුණෑගල	10	කෙසෙල්	10.53	10
		එකතුව	10.53	10
මහනුවර	5	කෙසෙල්	6.62	13
		එකතුව	6.62	13
මාතලේ	25	උඳු.තල,කුරක්කන්	4.54	16
		එකතුව	4.54	16
අනුරාධපුරය	5	උඳු.තල,කුරක්කන්	6.47	10
		එකතුව	6.47	10
කළුතර	45	අන්නාසි	10.59	9
		එළවළු	1.52	13
		කෙසෙල්	9.33	4
		වැල් දොඩම්	2.62	4
		ඉඟුරු	0.54	1
එකතුව			24.60	31
මුළු එකතුව	**400**		**274.95**	**421**


වගු අංක XVI

2021 වසරේ දෙපාර්තමේන්තුවේ අතුරු භෝග වගා කිරීමේ වැඩසටහන යටතේ අතුරු බෝග වගා ඉලක්කය හෙක්. 400ක් වුවත් 2021 වගා කළ සමස්ත බිම් ප්‍රමාණය හෙක්.275 ක් පමණ වේ. ඒ අනුව අතුරු භෝග වගාවෙන් 69%ක භෞතික ප්‍රගතියක් මෙම වසර තුළ දී දෙපාර්තමේන්තුව අත් කරගෙන ඇත. එසේම හෙක්.73.67 ක එනම්,වැඩිම බිම් ප්‍රමාණයක අතුරු භෝග වගා කර ඇත්තේ කැගල්ල දිස්ත්‍රික්කයේ වන අතර මොණරාගල දිස්ත්‍රික්කයේ වගා කරන ලද භූමි ප්‍රමාණය හෙක්. 63.72 කි.

අතුරු භෝග වගාවට වැඩි නැඹුරුවක් සහිතව වැඩියෙන්ම අතුරු භෝග වගාව සිදු කළ ගොවීන් ප්‍රමාණයක් කැගල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවලින් වාර්තා වේ. එම අගය පිළිවෙළින් 114 හා 110 ක් වේ. අතුරු භෝග වගාව සිදු කරන ලද සමස්ත ගොවීන්ගෙන් 53%ක් එම දිස්ත්‍රික්ක දෙක තුළ නියෝජනය වීම ද විශේෂ තත්ත්වයකි. භෝග වර්ග වැඩිම ප්‍රමාණයක් වගා කර ඇත්තේ කැගල්ල දිස්ත්‍රික්කයේ බව ද (වර්ග 7ක්) ඉහත වගුවෙන් තවදුරටත් පෙනී යයි.

පහත සඳහන් ප්‍රස්තාරය මඟින් අතුරු භෝගය අනුව වගා කළ බිම් ප්‍රමාණය නිරූපණය කර ඇත.

අතුරු භෝග වගාව- 2021



ප්‍රස්තාර අංක IV

සමස්ත අතුරු භෝග වගා බිම් හෙක්.275 න් 38%ක වගා කර ඇත්තේ අන්නාසි වගාව වේ. එසේම කෙසෙල් වගාවත් 35%ක භූමි ප්‍රමාණයක වගා කර ඇත. අන්නාසි වගාව දිස්ත්‍රික්ක 7ක හා කෙසෙල් වගාව දිස්ත්‍රික්ක 8 ක මෙම වර්ෂය තුළ වගා කර ඇත. නඩත්තු කටයුතු පහසු වීම, අස්වනු නාස්තිය අවම වීම, දේශීය හා විදේශීය වෙළඳපොළ තුළ වර්ෂය පුරා ඒකාකාරී ඉල්ලුමක් පැවතීම යන හේතු නිසා කෙසෙල් හා අන්නාසි වගාව වෙත වගාකරුවන් වැඩි වශයෙන් යොමු වී ඇත. භූමි ප්‍රමාණයෙන් 38%ක අන්නාසි වගාවත්, 35%ක බිම් ප්‍රමාණයක කෙසෙල් වගාවත්, 27% ක බිම් ප්‍රමාණයක වෙනත් භෝග ද වගා කර ඇත.

2.7. රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම

2.7.1. කිරි කැපුම් ශිල්පී පුහුණුව (සාමාන්‍ය)

නිවැරදිව කිරි අස්වනු නෙළා ගැනීම සඳහා මනා පරිචයක් කිරි කපන්නන් තුළ පැවතීම අත්‍යවශ්‍ය වේ. රබර් ශාකයෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමටත්, දශක 3 කට ආසන්න කාලයක් කිරි අස්වැන්න ලබා ගැනීමත්, දිලීර හා බැක්ටීරියා ආසදනවලට ශාකය ගොදුරු නොවීමට වග බලා ගත හැකි වීමත්, නිවැරදි කිරි කැපීමේ හැකියාව හා දැනුම මඟින් සැලසෙන වාසි වේ. මේ සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වාර්ෂිකව කිරි කපන්නන් පුහුණු කරනු ලබයි.



කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ප්‍රාදේශීය කාර්යාලවල සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. එහිදී රබර් සංවර්ධන නිලධාරී කොට්ඨාශ මට්ටමින් කුඩා රබර් වතු හිමියන්ට තමන්ගේ වගාවේ ඵලදාව විධිමත් ලෙස තමාටම ලබා ගැනීමට හැකියාව ඇති කිරීමටත්, වෘත්තියක් ලෙස කිරි කැපීම් කාර්යයේ යෙදීමට කැමති අයටත් මෙම වැඩසටහන මඟින් අවශ්‍ය පුහුණුව ලබා දෙයි.

ඒ අනුව සෑම පුහුණුලාභියෙකුටම, රබර් කර්මාන්තය ආශ්‍රිත ආර්ථික, පාරිසරික හා සමාජීය වැදගත්කම, ගස තෝරා ගැනීම, රබර් ගසේ පටක හඳුනා ගැනීම, කැපුම් ක්‍රම හඳුන්වා දීම, රබර් සැකසීම සම්බන්ධයෙන් දැනුම, කිරි පිහිය මුවහත් කිරීම, නිදහස් කිරි කැපීම, කැපුම් සලකුණු කිරීම හා සලකුණු ඔස්සේ කිරි කැපීම, රබර් කිරි කැපීමට අවහිර නොවන ලෙස වැසි ආවරණ සවි කිරීම යන කරුණු පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක්ද ලබා දීම සිදු වේ.

2021 වර්ෂයේ කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණු වැඩසටහන සම්බන්ධ තොරතුරු පහත වගුවෙහි දක්වා ඇත.

ප්‍රාදේශීය කාර්යාලය	කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන (සාමාන්‍ය)			
	ඉලක්කය (පුද්ගලයින්)	**පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව**	**පුහුණුව ලැබූ සංඛ්‍යාව**	**වැයවූ මුදල (රු.)**
රත්නපුර	260	5	113	169,088.00
මොනරාගල	230	22	110	193,076.00
කෑගල්ල	380	17	269	444,000.00
කළුතර	230	2	43	66,275.00
එකතුව	**1100**	**46**	**535**	**872,439.00**

වගු අංකXVII

2021 වර්ෂයේ දී පුද්ගලයින් 1100 ක් සඳහා කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ලබා දීමට ඉලක්ක කළ ද පුහුණුව ලබා දීමට හැකි වී ඇත්තේ පුද්ගලයින් 535 ක් සඳහා පමණකි. එය 49% ක

භෞතික ප්‍රගතියක් ළඟා කර ගැනීමකි. කොවිඩ් 19 වසංගත තත්ත්වය වරින් වර උත්සන්න වීමත් සමඟ නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීමත්, සාමාන්‍ය ජන ඒකරාශි ක්‍රියාකාරකම් අත්හිටුවීමත් නිසා අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට දැඩි අභියෝගයක් විය. මෙම හේතු ප්‍රගතිය අඩාල වීමට සෘජුවම බලපා ඇත.

2.7.2. බද්ධකරුවන් පුහුණු වැඩසටහන

ගුණාත්මක බවින් ඉහළ සාර්ථක බද්ධ රබර් පැළයක් තුළින් වගාකරුවාට හොඳ ආදායම් මාර්ගයක් සරිකර ගැනීමට අවැසි මාර්ගය සකසයි. ගුණාත්මක රබර් පැළයක් නිෂ්පාදනය සඳහා විධිමත් ක්‍රමානුකූල දැනුමක් සහිත බද්ධකරුවෙකුගේ සහාය අත්‍යවශ්‍ය වේ. ඒ අනුව පැළ බද්ධ කිරීමේ කාර්යයේ නියුතු පුද්ගලික පැළ තවාන්කරුවන්, රජයේ පැළ තවාන්වල සේවකයින් මෙන්ම පැළ බද්ධ කිරීමේ කාර්යය සඳහා යොමු වීමට කැමැත්තක් දක්වන ආධුනිකයින් මෙම පුහුණු වැඩසටහන සඳහා ඉලක්කගත වේ. දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ ක්‍රියාත්මක කරන ලද බද්ධකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

ප්‍රාදේශීය කාර්යාලය	බද්ධකරුවන් පුහුණුව			
	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණු කළ සංඛ්‍යාව	වැයවූ මුදල (රු.මී)
රත්නපුර	30	1	30	42,740.00
මොනරාගල	60	2	60	98,620.00
ගාල්ල	30	1	22	37,445.00
කළුතර	20	1	20	27,690.00
එකතුව	**140**	**5**	**132**	**206,495.00**

වගු අංක XVIII

2021 වර්ෂයේ දී ඉලක්කගත පුහුණු බද්ධකරුවන් සංඛ්‍යාව 140 ක් වූ අතර එම ඉලක්කය අනුව පුද්ගලයින් 132 ක් පුහුණු කිරීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත. මෙම වැඩසටහන වෙනුවෙන් වෙන් කළ රු.මී 0.22 කින් රු.මී. 0.21 ක් වැය කර 95% ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගැනීමට දෙපාර්තමේන්තුව සමත්ව ඇත.

2.7.3. වැසි ආවරණ යෙදීමට පුහුණු කිරීමේ වැඩසටහන

තෙත් කලාපීය බිම් ආශ්‍රිතව සිදු කරන වගාවක් වන රබර් වගාව වසරේ වැඩි කාලයක් වර්ෂාවට මුහුණ දීම සාමාන්‍ය තත්ත්වයකි. වර්ෂාව නිසා කිරි අස්වනු නෙලීම වසර පුරා වරින් වර අඩාල වේ. ඊට රබර් පර්යේෂණ ආයතනය ලබා දුන් විසඳුම් අතර, දැනට වඩාත් සාර්ථකම තෝරා ගැනීම වන්නේ වැහි ආවරණ යෙදීමේ ක්‍රමයයි. ඒ අනුව වාර්ෂිකව අයවැය මගින් වැසි ආවරණ යෙදීම සඳහා මුදල් වෙන් කරන අතරම, නිසි පරිදි වැසි ආවරණ යෙදීමේ ක්‍රමවේදය හඳුන්වා දීම සඳහා දෙපාර්තමේන්තුව මැදිහත් වීමෙන් වැසි ආවරණ යෙදීමේ පුහුණු වැඩසටහන පවත්වයි. රබර් ගසට හෝ කිරි අස්වැන්නට හානි නොවන පරිදි ඵලදායී ලෙස වැසි ආවරණ යෙදීමේ නිසි ක්‍රමවේදය වගාකරුවන්ට හා ශ්‍රමිකයන්ට හඳුන්වා දීම මෙම වැඩසටහනේ පරමාර්ථය වේ.

ඒ අනුව 2021 වර්ෂයේ වැසි ආවරණ යෙදීම සම්බන්ධ පුහුණුව ලැබූ පුහුණුලාභීන් ගැන තොරතුරු පහත දැක්වේ.

ප්‍රාදේශීය කාර්යාලය	වැහි ආවරණ පුහුණුව			
	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණු කල සංඛ්‍යාව	වැය වූ මුදල (රු.)
රත්නපුර	120	5	122	101,979.60
ගාල්ල	50	4	52	13,217.20
කෑගල්ල	280	7	195	159,420.00
කළුතර	120	6	160	97,852.78
එකතුව	**570**	**22**	**529**	**372,469.58**

වගු අංක XIX

2021 වර්ෂයේ වැසි ආවරණ යෙදීමේ පුහුණු වැඩසටහන් 22ක් මඟින් පුද්ගලයින් 529 දෙනෙකු පුහුණු කර ඇත. ඒ සඳහා දරන ලද සමස්ත පිරිවැය රු.මි. 0.37 කි.

එසේම රබර් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ක්‍රියාත්මක වූ වැහි ආවරණ යෙදීමට පුහුණු කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය කාර්යාල අතරින් කළුතර ප්‍රාදේශීය කාර්යාලය පුද්ගලයින් 160 ක් සඳහා පුහුණුව ලබා දෙමින් වාර්ෂික ඉලක්කය අභිබවා ඉහළම ප්‍රගතියක් ලබා ගෙන ඇත.

2.7.4. පාංශු සංරක්ෂණ පුහුණු වැඩසටහන

රබර් වගා බිම්වල පස නිසරු වීමත්, ඛාදනයට ලක් වීමත්, ඵලදායිතාවය හීනවීමත් බොහෝ විට සිදු වේ. සැබැවින්ම එවැනි ගැටලු භූමිය තුළ ඇති වන්නේ, නිසි ලෙස රබර් වගා ඉඩම්වල පස හා භූමිය නිසි පරිදි කළමණාකරණය නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස ය. මෙම තත්ත්වය සළකා බලා දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීමේ පුහුණු වැඩසටහන් ප්‍රාදේශීය කාර්යාල ඔස්සේ ක්‍රියාත්මක කරනු ලැබේ.

2021 වර්ෂයේ සිදු කළ පාංශු සංරක්ෂණ වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

ප්‍රාදේශීය කාර්යාලය	පාංශු සංරක්ෂණ පුහුණුව			
	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණු කල සංඛ්‍යාව	වැය වූ මුදල (රු.)
රත්නපුර	65	3	71	31,708.00
මොනරාගල	40	1	5	4,292.00
කෑගල්ල	110	1	11	-*
කළුතර	60	1	37	12,977.52
එකතුව	**275**	**6**	**124**	**48,977.52**

වගු අංක XX

*පුහුණුව පවත්වන ලද අදාළ වත්තේ වතු හිමියා විසින් වියදම දරන ලදී.

දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී පාංශු සංරක්ෂණ පුහුණුව සඳහා වූ පුද්ගලයින් 275ක ඉලක්කයකින් 124 දෙනෙකු පුහුණු කර ඇත. ඒ සඳහා රු.48,977.52 ක මුල්‍ය පිරිවැයක් දරා ඇත. පාංශු සංරක්ෂණ පුහුණුව යටතේ පුද්ගලයින් 71 ක් පුහුණු කරඇත්තේ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය මගිනි.ඉහත පුහුණු වැඩසටහන්වලට අමතරව,

- ගෘහාශ්‍රිත රබර් භාණ්ඩ නිෂ්පාදන පුහුණුව
- අපරිනත හා පරිනත වගා නඩත්තු පුහුණුව
- දුම් ගෙවල් ඉදි කිරීම
- කිරි කැපීම සම්බන්ධ දෙදින වැඩමුළුව
- රබර් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ එක් දින වැඩමුළුව
- ගොවිපළ ඒකක සංවර්ධනය
- මී මැසි පාලනය පිළිබඳ පුහුණුව
- ආදර්ශ ගොවිපළ ඒකක ඇති කිරීම
- රබර් ෂීට් නිෂ්පාදන පුහුණුව
- රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ එක් දින වැඩමුළුව, වැනි පුහුණු වැඩසටහන් ද ක්‍රියාත්මක කර ඇත.

2.8. 2021 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

වාර්ෂික අයවැය කථාව මඟින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ ඉදිරිපත් කර අනුමත වූ ප්‍රධාන ව්‍යාපෘති දෙකක් යටතේ වූ උප ව්‍යාපෘති 14ක් 2021 වර්ෂයේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

- **කුඩා රබර් වතුවල ආදායම් මාර්ග විවිධාංගිකරණය කිරීම, දිරි ගැන්වීම තුළින් එම ඉඩම් ලාභදායී වාණිජ ඒකක බවට පත් කිරීම (මිලියන 40)**

ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදනය කි.ග්‍රෑම් මිලියන 100 දක්වා ඉහළ නැංවීම හා කුඩා රබර් වතු හිමියන්ගේ රබර් ඉඩම් ලාභදායී වාණිජ ඒකක බවට පත් කිරීම තුලින් කුඩා රබර් වතු හිමියන් නගා සිටුවීම උදෙසා මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි. රබර් වගාවේ අපරිණත අවධියේදී නිසියාකාර ආදායමක් උපයාගත නොහැකි වන අතරම පරිණත අවධියේදී මිල පහළ යාම නිෂ්පාදන වියදම අධික වීම වැනි හේතු මත ආදායම ස්ථාවරව නොපවතින බැවින් රබර් වගා භූමිය තුළ වෙනත් ආදායම් මාර්ගයක් සලසා ගැනීම තුළින් කුඩා රබර් වතු හිමියන්ගේ රබර් ඉඩම් ලාභදායී වාණිජ ඒකක බවට පත් කිරීමට රාජ්‍ය දායකත්වය හා ප්‍රතිලාභ දායකත්වය සහිතව මෙම ව්‍යාපෘතිය නිම කරන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ වූ උප ක්‍රියාකාරකම්වල අත්කර ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

වැඩසටහන/ව්‍යාපෘතිය	ඉලක්කය (ඒකක)	නිම කර ඇති(ඒකක)	අනුමත ප්‍රතිපාදන රු.	වැය කළ මුදල රු.
ආදර්ශ රබර් වගාවන් ස්ථාපනය කිරීම	75	64	28,050,000.00	26,960,381.20
රබර් වගාවේ මායිම් වැට ආශ්‍රිතව පුවක් වගාව සිදුකිරීම	150	150	180,000.00	180,000.00
රබර් වගාව සමඟ ඇන්තූරියම් වගාව	16	14	800,000.00	700,000.00
රබර් ආශ්‍රිත කුකුල් පාලනය	35	34	1,750,000.00	1,697,000.00
රබර් වගාව සමඟ මී මැසි පාලනය **(05)**	50	45	1,100,000.00	963,066.66
රබර් වගාව සමඟ මී මැසි පාලනය **(10)**	69	64	2,760,000.00	1,939,200.00
රබර් වගාව සමඟ තේ වගාව	10	3	1,050,000.00	380,100.00
රබර් සමඟ අන්නාසි වගාව	12	12	2,250,000.00	2,250,000.00
රබර් වගාව ආශ්‍රිත බිම්මල් වගාව	24	15	1,560,000.00	975,000.00
පරිපාලන හා මෙහෙයුම් වියදම්			500,000.00	-
එකතුව			40,000,000.00	36,044,747.86

වගු අංක XXI



රබර් වගාව ආශ්‍රිත ඇන්තූරියම් වගාව



රබර් වගාව ආශ්‍රිත කුකුළ් පාලනය



රබර් වගාව ආශ්‍රිත පුවක් වගාව



රබර් වගාව ආශ්‍රිත මී මැසි පාලනය

- **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හට රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ඇති කිරීම සඳහා සහනාධාර ලබාදීම (මිලියන 20)**

දේශීය රබර් පරිභෝජනය වැඩි කිරීම, දේශීය රබර් සඳහා ඉල්ලුම වැඩි කිරීම, රබර් වගාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සුලබ කිරීම, රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය වැඩි කිරීම සහ රබර් ආනයන වියදම අඩු කිරීම ආදී අරමුණු මුල් කොට ගනිමින් රබර් ආශ්‍රිත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඇති කිරීම හා දැනට එම කර්මාන්තයේ යෙදී සිටින ව්‍යවසායකයින් නගා සිටුවීම අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා 2021 අයවැය යෝජනා යටතේ රු. මිලියන 20 ක ප්‍රතිපාදන ලබාදී ඇති අතර ඊට අදාළ ක්‍රියාකාරකම් ලෙස පහත සඳහන් රබර් ආශ්‍රිත කර්මාන්ත සාර්ථකව නිම කරන ලදි.



සමූහ සැකසුම් මධ්‍යස්ථානයක රබර් වියළීම



සමූහ සැකසුම් මධ්‍යස්ථානයක සවි කළ ඩයමන්ඩ් රෝල් යන්ත්‍රය

වැඩසටහන/ව්‍යාපෘතිය	ඉලක්කය (ඒකක)	නිම කර ඇති ඒකක ප්‍රමාණය	2021 වර්ෂයේ අනුමත ප්‍රතිපාදන රු.	වැය කළ මුදල රු.
කි.ග්‍රෑම් 200 සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදි කිරීම.	11	8	11,000,000.00	7,530,000.00
කි.ග්‍රෑම් 50 සැකසුම් මධ්‍යස්ථාන ඉදි කිරීම.	17	18	7,650,000.00	7,080,000.00
පරිණත වගාවේ අස්වැන්න එකතු කිරීම සඳහා කිරි කෝප්ප රඳවන යෙදවීම.	1	1	200,000.00	150,000.00
ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය පෙණ පතුරු හා කිරි පෙරන නිපදවීම.	2	2	100,000.00	100,000.00
වැහි ආවරණ යෙදීම සඳහා ගම් මිශ්‍රණය (සීලන්ට්) නිපදවීමේ කර්මාන්ත දියුණු කිරීම.	2	2	800,000.00	800,000.00
පරිපාලන හා මෙහෙයුම් වියදම්			250,000.00	-
එකතුව			20,000,000.00	15,660,000.00

වගු අංක XXII

2.9. එක් දින වියළුම් කුටීර ඉදි කිරීම හා ඇඹරුම් රෝල් ලබාදීම

ගුණාත්මක භාවයෙන් උසස් රබර් ෂීට් නිෂ්පාදනය කර වෙළඳපොළට සැපයීම හා ගොවියාට නිසි මිලක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් 2021 වර්ෂයේ දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මීට ප්‍රථම සාම්ප්‍රදායිකව ගොවීන් විසින් නිවස තුළම රබර් ෂීට් සැකසීම සිදු කරන ලද අතර ඒ සඳහා දින කීපයක් ගත විය. එසේම එම ක්‍රමය යටතේ ගුණාත්මක නිෂ්පාදනයක් බිහි වීම සිදු නොවේ. ඒ අනුව නව විද්‍යාත්මක හා නව තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගනිමින් රබර් ෂීට් සැකසීමට හා වියළීමට නිවසින් පරිබාහිර ආරක්ෂිත සුදුසු ස්ථානයක් ඉදි කිරීමට එක් දින වියළුම් කුටීර හෙවත් දුම් ගෙවල් ඉදි කිරීම අත්‍යවශ්‍ය වේ. මෙමගින් දින කීපයක් පුරා වියළා සැකසූ රබර් ෂීට් එක් දිනකින් වියළීමටත්, ගුණාත්මක තත්ත්වයෙන් උසස් පිරිසිදු රබර් ෂීට් සැකසීමටත් හැකියාව ලැබේ. දෙපාර්තමේන්තුව නිසි ප්‍රමිතියෙන් යුත් එක් දින වියළුම් කුටීර ඉදි කිරීමට වාරික 3 කින් රු. 150,000ක සහනාධාර මුදලක් වගාකරුවන්ට ගෙවීම සිදු කරන අතර, ඉදිකිරීම් කටයුතු දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නඩත්තු නිලධාරියාගේ හා රබර් සංවර්ධන නිලධාරියාගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

2021 වර්ෂයේ එලෙස ඉදිකරන ලද එක් දින වියළුම් කුටීර පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ඉලක්කය (කුටීර ගණන)	භෞතික ප්‍රගතිය		වැය කල මුදල රු .මි.
	ආරම්භ කළ සංඛ්‍යාව	වැඩ අවසන් කළ සංඛ්‍යාව	
200	174	159	23.23

වගු අංක XXIII

2021 දී එක් දින වියළුම් කුටී 200ක් ඉදි කිරීම සඳහා ඉලක්ක කළ අතර ඉන් කුටි 174ක ඉදි කිරීම ආරම්භ කළමුත් වර්ෂ අවසානය වන විට වැඩ නිම කළ කුටී සංඛ්‍යාව 159 ක් පමණි.



දෙපාර්තමේන්තු සහනාධාර යටතේ නිම කරන ලද එක් දින වියළුම් කුටීරයක්



රබර් ෂීට්වලට දුම් ගැසීම සඳහා යොදා ගන්නා දුම් උදුන





දුම් ගෙයක අභ්‍යන්තර වියළුම් කොටස

එක් දින වියළුම් කුටී ඉදිකිරීමේ වැඩසටහනට සමගාමීව වගාකරුවන් සඳහා ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදනයට ඩයමන්ඩ් රෝල් හා ස්මුත් රෝල් යන්ත්‍ර නිෂ්පාදකයින්ට සැපයීම අත්‍යවශ්‍ය වේ.

මෙම යන්ත්‍ර ලබා ගැනීම සඳහා සහනාධාර වශයෙන් එක් නිෂ්පාදකයෙකුට 40,000ක මුදලක් ලබා දෙනු ලැබේ. ඒ අනුව 2021 වසර සඳහා රු.මි.4.82 ක් වැය කරමින් යන්ත්‍ර කට්ටල 115ක් නිෂ්පාදකයින් වෙත ලබා දී ඇත.

වැඩසටහන	ඉලක්කය (යන්ත්‍ර කට්ටල ගණන)	ලබා දුන් (යන්ත්‍ර කට්ටල ගණන)	වැය කළ මුදල (රු.මි.)
ඩයමන්ඩ් රෝල් හා ස්මුත් රෝල් යන්ත්‍ර ලබා දීම.	**200**	**115**	**4.82**

වගු අංක XXIV

2.10. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු- 2021

2.10.1. රබර් වගා බිම් ප්‍රමාණය

2010 වසරේ දිවයිනම ආවරණය වන පරිදි සිදු කරන ලද රබර් ඉඩම් සංගණනයේ දත්ත මත පදනම් ව වාර්ෂිකව සිදු කරනු ලබන නව වගා ප්‍රමාණය හා වගාවෙන් ඉවත් වන ඉඩම් ප්‍රමාණය අනුව ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තු ගත රබර් ඉඩම් ප්‍රමාණය ගණනය කර ඇත.

රබර් ඉඩම් ප්‍රමාණය(2010 – 2021)

වර්ෂය	ඇස්තමේන්තුගත බිම් ප්‍රමාණය (හෙක්.)		
	කුඩා වතු අංශය	ප්‍රාදේශීය වැවිලි සමාගම්/රාජ්‍ය වතු	එකතුව
2010 (රබර් ඉඩම් සංගණනයෙන් වාර්තා වූ බිම් ප්‍රමාණය)	79,395	46,250	125,645
2011	80,018	48,516	128,534
2012	82,170	48,610	130,780
2013	86,529	47,821	134,350
2014	87,735	47,975	135,710
2015	89,429	46,991	136,420
2016	87,862	48,278	136,140
2017	88,412	48,213	136,625
2018	89,243	47,863	137,106
2019	90,195	47,413	137,608
2020	89,592	48,242	137,834
2021	**90,498**	**48,124**	**138,622**

වගු අංක XXV

2019 වසරට සාපේක්ෂව 2020 වසරේදී කුඩා වතු අංශයේ බිම් ප්‍රමාණය අඩු වීමක් සිදු වුවද නැවතත් බිම් ප්‍රමාණය 2021 වසරේදී වැඩි වී ඇත. වගා සහනාධාර කටයුතු වඩාත් විධිමත් කිරීම තුළින් නව වගා කරන බිම් ප්‍රමාණය වර්ධනය වීම, STaRR ව්‍යාපෘතිය ආදී නව වැඩසටහන් මඟින් රබර් නව වගාව සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම හා රබර් සඳහා වෙළඳපොළ තුළ හොඳ මිලක් හිමි වීම නිසා වගාකරුවන් තුළ උනන්දුව වැඩි වීම යනාදිය රබර් බිම් ප්‍රමාණය ඉහළ යාමට හේතු වී ඇත.

2.10.2. රබර් නිෂ්පාදනය

ස්වාභාවික රබර් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) 2012–2021

වර්ෂය	ස්වාභාවික රබර් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)
2012	152,050
2013	130,421
2014	98,573
2015	88,567
2016	79,100
2017	83,070
2018	82,560
2019	74,753
2020	78,205
2021	76,884

වගු අංක XXVI

2021 වසරේ රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 76,884 කි. එම අගය 2020 වසර හා සැසඳීමේදී මෙට්‍රික් ටොන් 1321කින් පහළ යාමකි. 2021 වසරේ වරින් වර ඇති වූ සංචරණ සීමා නිරෝධායන ඇදිරි නීතිය හේතුවෙන් සැප්තැම්බර් හා ඔක්තෝබර් යන මාසවල යම් නිෂ්පාදන අඩුවීම හා ඊසාන දිග මෝසම් වර්ෂා කාලය සක්‍රීය වීමත් සමඟ පැවති අධික වර්ෂාව නිෂ්පාදනය පහළ බැසීම සඳහා හේතු පාදක වී ඇත.

2012 වර්ෂයේ සිට වාර්ෂික රබර් නිෂ්පාදනය ශීඝ්‍ර පහළ යාමක් පෙන්නුම් කරනු ලබන නමුත් 2016 වර්ෂයේ සිට එය මෙට්‍රික් ටොන් 84,000 – 74,000 ත් අතර ඉහළ පහළ යමින් පැවත ඇති බව නිරීක්ෂණය වේ.

ලෝක රබර් නිෂ්පාදනය - 2021 (මෙට්‍රික් ටොන් දහස්)

රට	රබර් නිෂ්පාදනය 2020	රබර් නිෂ්පාදනය 2021
තායිලන්තය	4,787	4,836
ඉන්දුනීසියාව	3,037	3,045
වියට්නාමය	1,226	1,260
චීනය	693	851
ඉන්දියාව	685	757
මැලේසියාව	515	470
කාම්බෝජය	349	368
මියන්මාරය	267	290
බංගලාදේශය	22	22
පැපුවා නිව්ගිනියා	6	6
පිලිපීනය	106	172
ශ්‍රී ලංකාව	78	77
අනෙකුත් රටවල්	1,796	1,953
ලෝක නිෂ්පාදනය	13,567	14,107

මූලාශ්‍රය- ස්වාභාවික රබර් නිෂ්පාදනය කරන රටවල සංගමයේ (ANRPC) දත්ත ඇසුරෙන්

වගු අංක XXVII

2020 වර්ෂයට සාපේක්ෂව 2021 වසරේ ලෝක රබර් නිෂ්පාදනය මෙ.ටො.දහස් 542 කින් වැඩි වී ඇත. 2020 වර්ෂයේ මෙන්ම 2021 වර්ෂයේදී ද වැඩිම රබර් නිෂ්පාදනයක් සිදු කර ඇත්තේ අග්නිදිග ආසියාතික රටක් වන තායිලන්තය වේ.

2.10.3. රබර් නිෂ්පාදන වියදම

රබර් නිෂ්පාදන වියදම 2007 – 2021(කි.ග්‍රෑම් 1 ක් /රුපියල්)

වර්ෂය	වැවිලි සමාගම්	කුඩා වතු අංශය
2007	102.31	112.69
2008	119.89	114.00
2009	135.83	118.56
2010	158.94	119.83
2011	188.23	129.56
2012	207.00	136.00
2013	245.00	150.00
2014	280.00	160.00
2015	285.00	170.00
2016	286.41	180.00
2017	290.00	195.00
2018	300.00	205.00
2019	301.50	210.00
2020	349.55	213.50
2021	364.91	221.00

වගු අංක XXVIII

රබර් නිෂ්පාදන වියදම සැළකීමේදී 2021 වසරේදී වියළි රබර් කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය සඳහා කුඩා වතු අංශයේ සාමාන්‍ය නිෂ්පාදන වියදම රු. 221.00කි. එය 2020 වර්ෂයේ එය රු.213.50 ක් වූ අතර 2021 වන විට නිෂ්පාදන වියදම රු.7.50කින් ඉහළ ගොස් ඇත. 2021 වසරේදී වියළි රබර් කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය සඳහා වැවිලි සමාගම් අංශයේ සාමාන්‍ය නිෂ්පාදන වියදම රු. 364.91.00 ක් වන අතර 2020 වසරේ එකී අගය රු. 349.55 කි.

2.10.4. දේශීය රබර් පරිභෝජනය– 2021

රබර් වගාව මෙරට ආරම්භ කළ අවධියේ සමස්ත වාර්ෂික රබර් නිෂ්පාදනය අමුද්‍රව්‍යයක් ලෙස ඍජුවම අපනයන වෙළඳපොළ වෙත කේන්ද්‍ර කොට පැවති නමුත්, වර්තමානය වනවිට අමුද්‍රව්‍ය ලෙසම අපනයනය නොකර, ඉන් වැඩි ප්‍රමාණයක් නිමි භාණ්ඩ ලෙස අපනයනය කිරීම තුළින්, රබර් ආශ්‍රිතව ලබන අපනයන ආදායම වැඩි වීමට ද හේතු වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ රබර් ආශ්‍රිත දේශීය නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩි වශයෙන් රබර් පරිභෝජනයක් පවතී.

දේශීය රබර් පරිභෝජනය (2015 – 2021)

වර්ෂය	(මෙ.ටො.)
2015	127,564
2016	141,940
2017	128,142
2018	135,238
2019	112,556
2020	112,080
2021	133,849

වගු අංක XXIX

ඉහත වගුව අනුව 2021 වර්ෂයේදී ද ස්වභාවික රබර් මෙට්‍රික් ටොන් 133,849ක රබර් පරිභෝජනයක් රට තුළ සිදුව ඇත. 2021 වසරේ සමස්ත වාර්ෂික රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 76,884 ක් වුයෙන් ඉතිරි පරිභෝජන අවශ්‍යතාවය සඳහා ආනයනය කරන ලද රබර් යොදා ගෙන ඇත.

2.10.5. ස්වාභාවික රබර් අපනයනය

2020 වර්ෂය සමඟ සසඳන විට 2021 වර්ෂයේදී ලංකාවේ රබර් අපනයනයේ සුළු අඩුවීමක් සිදු වී ඇත.

2020 හා 2021 වර්ෂයේ අපනයනය කළ ස්වාභාවික රබර් ප්‍රමාණයන්

මාසය	අපනයනය කළ ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	
	2020	2021
ජනවාරි	1,361	1,722
පෙබරවාරි	1,634	1,139
මාර්තු	725	2,306
අප්‍රේල්	705	1,208
මැයි	948	754
ජුනි	1,533	904
ජූලි	1,773	1,073
අගෝස්තු	846	1,405
සැප්තැම්බර්	1,130	1,892
ඔක්තෝබර්	1,271	1,117
නොවැම්බර්	1,671	1,033
දෙසැම්බර්	2,169	937
එකතුව	**15,766**	**15,490**

වගු අංක XXX

2.10.6. ශ්‍රී ලංකාවේ සමස්ත රබර් අපනයනය

ශ්‍රී ලංකාවේ රබර් අපනයනය පිළිබඳ සංඛ්‍යා ලේඛන පිරික්සීමේදී ඉතා වැදගත්ම වසරක් ලෙස 2021 වසර හඳුන්වා දිය හැකි ය. අපනයන ඉතිහාසයේ වාර්තාගතම ආදායම ලෙස රු.මි. 217,316 ක් ලබමින් විදේශ විනිමය ඩොලර් බිලියන 01ක වටිනාකමක් දේශීය ආර්ථිකයට එකතු කිරීමට එම වසරේ දී රබර් අංශයට හැකියාව ලැබී ඇත.

මුළු රබර් අපනයනය සහ අපනයන ආදායම - 2021

වර්ගය	අපනයනය කළ ප්‍රමාණය	අපනයනය වටිනාකම (රු.මි.)
ස්වාභාවික රබර් (කි.ග්‍රෑම්)	15,490,180	8,376.68
කෘත්‍රිම රබර් (කි.ග්‍රෑම්)	8,085	0.67
අර්ධ නිමි රබර් (කි.ග්‍රෑම්)	6,519,825	621.20
නිමි භාණ්ඩ (කි.ග්‍රෑම්)	62,604,804	89,994.06
නිමි භාණ්ඩ (ඒකක)	48,715,574	118,359.06
සමස්ත රබර් අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑම්)	84,622,894	98,992.62
සමස්ත රබර් අපනයන ප්‍රමාණය (ඒකක)	48,715,574	118,359.06
එකතුව		**217,351.67**

වගු අංක XXXI

ශ්‍රී ලංකාවේ ස්වාභාවික රබර් මිලදී ගත් ප්‍රධාන රටවල් 2021

රට	මිලදී ගත් ප්‍රමාණය (මෙ.ටො.)	ප්‍රතිශතය
පකිස්තානය	4,363	28%
මැලේසියාව	2,121	13%
ජපානය	1,657	11%
ජර්මනිය	1237	8%
චීනය	980	6%
ඉතාලිය	760	5%
ඇමරිකාව	573	4%
වියට්නාමය	489	3%
නෙදර්ලන්තය	426	3%
බ්‍රසීලය	431	3%
අනෙකුත් රටවල්	2,453	16%
එකතුව	**15,490**	**100%**

වගු අංක XXXII

2.10.7. ස්වාභාවික රබර් ආනයනය

දේශීය රබර් ගොවියා ආරක්ෂා කර ගැනීම අරමුණුකර ගනිමින් ශ්‍රී ලංකා රජය රබර් ආනයනය කිරීම සීමා කරමින් ආනයනික තීරු බදු ඉහළ දමා ඇතත්, යම් යම් කොන්දේසි යටතේ දේශීය නිෂ්පාදන අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් රබර් ආනයනයට ඉඩකඩ සපයා දී තිබේ. ඒ අනුව 2021 වසරේ ආනයනය කළ රබර් ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

ස්වාභාවික රබර් ආනයනය කළ ප්‍රමාණයන් - 2020 හා 2021

මාසය	ආනයන ප්‍රමාණය (මෙ.ටො.)	
	2020	2021
ජනවාරි	5,831	3,716.6
පෙබරවාරි	6,618	7,661.4
මාර්තු	7,109	5,896.3
අප්‍රේල්	1,878	5,917.3
මැයි	3,203	2,967.3
ජුනි	2,640	5,068.2
ජූලි	3,999	4,488.2
අගෝස්තු	4,583	7,036.4
සැප්තැම්බර්	4,176	4,393.2
ඔක්තෝබර්	3,714	6,949.2
නොවැම්බර්	2,049	8,143.3
දෙසැම්බර්	2,828	9,830.8
එකතුව	**48,628**	**72,068.20**

වගු අංක XXXIII

2021 වර්ෂය තුළ රබර් මෙට්‍රික් ටොන් 72,068.20 ක් ආනයනය කර ඇති අතර මාසිකව වැඩිම රබර් ආනයන කිරීමක් සිදු කර ඇත්තේ දෙසැම්බර් හා නොවැම්බර් මාසවලදීය. එසේම 2020 වර්ෂයේ රබර් ආනයනය කළ මෙට්‍රික් ටොන් 48,628 ට වඩා මෙට්‍රික් ටොන් 23,440ක් 2021 වසරේ ආනයනය කර ඇති අතර එම වැඩි වීම 48% කි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වුයේ රබර් ආශ්‍රිත වෛද්‍ය ආරක්ෂණ උපකරණ වන ග්ලවුස් ඇතුළු පී.පී.ඊ. ඇඳුම්, බූට් ආදි නිෂ්පාදන වැඩි වශයෙන් නිෂ්පාදනය කිරීමයි.

වාර්ෂිකව ස්වාභාවික රබර් ආනයනය කළ ප්‍රමාණය

වර්ෂය	ස්වාභාවික රබර් (මෙ.ටොන්)
2012	15,675.60
2013	11,155.80
2014	29,225.00
2015	54,376.60
2016	72,984.90
2017	61,801.20
2018	65,759.00
2019	50,006.30
2020	48,628.00
2021	72,068.20

වගු අංක XXXIV

2018 වසරේ සිට ක්‍රමානුකූලව ආනයනික රබර් ප්‍රමාණය පහත වැටෙමින් පැවති නමුත්, 2021 වසරේ ගෝලීයව වැඩි වූ අවශ්‍යතාව මත එය ශීඝ්‍ර වැඩි වීමකට ලක් ව ඇත.

මුළු රබර් ආනයනය - 2021

වර්ගය	ආනයනය කළ ප්‍රමාණය	ආනයන වියදම (රු.මි.)
ස්වාභාවික රබර් (කි.ග්‍රෑම්)	72,068,198	27,461.81
කෘත්‍රිම රබර් (කි.ග්‍රෑම්)	79,606,901	39,179.14
අර්ධ නිමි රබර් (කි.ග්‍රෑම්)	36,922,897	6,655.98
නිමි භාණ්ඩ (කි.ග්‍රෑම්)	10,082,641	11,205.51
නිමි භාණ්ඩ (ඒකක)	4,029,765	16,542.17
නිමි භාණ්ඩ (Liter)	2,520	1.39
සමස්ත රබර් ආනයන ප්‍රමාණය (කි.ග්‍රෑම්)	198,680,637	84,502.43
සමස්ත රබර් ආනයන ප්‍රමාණය (ඒකක)	4,029,765	16,542.17
සමස්ත රබර් ආනයන ප්‍රමාණය (Liter)	2,520	1.39
එකතුව		**101,046.00**

වගු අංක XXXV

2021 වසරේ ආනයන ප්‍රමාණයේ 48% වැඩිවීමක් සිදු වුවා මෙන්ම ආනයනයේ වියදමේ ද සැලකිය යුතු වැඩිවීමකට භාජනය වී ඇත. ඒ 2020 වසරේ පැවති රු.මි.52,231ක අගය 2021 වසරේ දී රු.මි. 101,046 දක්වා වැඩි වීමෙනි.

රටවල් අනුව ස්වභාවික රබර් ආනයනය කළ ප්‍රමාණයන්

රට	ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො.)	ප්‍රතිශතය
වියට්නාමය	24,673	34.2%
තායිලන්තය	24,541	34.1%
ඉන්දුනීසියාව	16,885	23.4%
ඉන්දියාව	1,458	2.0%
අයිවරි කෝස්ට්	1,257	1.7%
සිංගප්පූරුව	1,223	1.7%
මැලේසියාව	1,010	1.4%
මියන්මාරය	720	1.0%
ගයානාව	181	0.3%
කාම්භෝජය	80	0.1%
අනෙකුත් රටවල්	40	0.1%
එකතුව	**72,068**	**100%**

වගු අංක XXXVI

2.10.8. ස්වාභාවික රබර් මිල

කොළඹ රබර් වෙන්දේසියේ රබර් වර්ග අනුව වාර්ෂික සාමාන්‍ය මිල
(කිලෝග්‍රෑම්1ක් රුපියල්)

වර්ෂය	වාර්ෂික සාමාන්‍ය මිල(රු.)		
	ෂීට් රබර් නො.1	ස්ක්‍රෑප් ක්‍රේප් නො.1.XBR	ලේටෙක්ස් ක්‍රේප් නො.1x
2019	288.48	245.05	302.26
2020	350.04	255.31	357.89
2021	460.51	409.76	636.87

වගු අංක XXXVII

කොළඹ රබර් වෙන්දේසියේ රබර්වල සාමාන්‍යමිල මාසිකව - 2021

	ෂීට් රබර් (ආර්.එස්.එස්)					ලේටෙක්ස් ක්‍රේප්					ස්ක්‍රැප් ක්‍රේප්					
	1	2	3	4	5	1X	1	2	3	4	1XBR	2XBR	3XBR	No.4	F.B.	SKIM
ජනවාරි	458.50	444.00	434.00	446.50	390.00	496.48	495.50	484.25	473.50	424.25	371.00	350.00	350.00	345.00	330.00	310.40
පෙබරවාරි	444.33	426.00	416.00	404.33	392.50	602.25	597.25	575.13	555.75	468.75	370.00	366.67	359.38	355.00	359.00	279.31
මාර්තු	426.50	420.00	409.00	395.00	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	508.00	498.33	418.00	381.67	357.33	343.67	336.50	ඉ.නැත	268.50
අප්‍රේල්	428.00	420.00	410.00	399.00	384.00	545.00	542.67	525.75	508.33	435.50	396.67	351.00	352.50	348.10	340.00	275.25
මැයි	450.25	445.00	432.50	415.00	398.00	630.00	624.00	635.00	575.00	505.00	396.00	410.00	405.00	386.50	380.00	340.00
ජූනි	467.00	ඉ.නැත	450.00	ඉ.නැත	ඉ.නැත	629.50	624.75	603.00	562.25	448.50	438.50	430.50	440.00	430.00	ඉ.නැත	396.00
ජූලි	454.50	450.00	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	640.00	636.50	609.80	565.60	418.75	412.63	412.00	420.67	412.88	ඉ.නැත	402.80
අගෝස්තු	456.50	443.50	435.00	415.00	418.00	665.00	662.00	622.50	560.00	416.00	412.50	413.00	416.50	413.75	ඉ.නැත	411.50
සැප්.	462.50	455.00	442.67	431.00	430.33	683.50	681.53	646.25	560.40	439.60	431.60	432.50	430.35	427.50	419.00	422.50
ඔක්.	488.00	476.00	463.00	454.00	450.00	697.50	694.25	656.25	573.75	460.00	449.00	445.00	449.75	442.33	434.00	430.40
නොවැ.	515.00	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	721.67	714.67	655.25	582.00	482.00	446.25	442.67	441.65	437.00	435.00	420.17
දෙසැම්බර්	475.00	464.00	463.00	460.00	455.00	694.63	687.50	605.67	522.33	432.67	411.33	410.67	410.67	406.00	395.00	402.00
සාමාන්‍ය	**460.51**	**444.35**	**435.52**	**424.43**	**414.73**	**636.87**	**632.78**	**593.90**	**544.77**	**445.75**	**409.76**	**401.78**	**401.73**	**395.05**	**386.50**	**363.24**

කොළඹ රබර් වෙන්දේසියේ රබර්වල සාමාන්‍ය මිල 2010 - 2021																
වර්ෂය	ෂීට් රබර් (ආර්.එස්.එස්)					ලේටෙක්ස් ක්‍රෙප්					ස්ක්‍රැප් ක්‍රේප්					
	1	2	3	4	5	1X	1	2	3	4	1XBR	2XBR	3XBR	No.4	F.B.	SKIM
2010	402.71	394.52	390.63	379.47	373.01	437.57	453.19	439.49	420.15	380.60	363.51	356.15	348.98	342.77	332.86	**315.42**
2011	513.05	504.56	492.45	486.12	470.92	575.65	566.93	542.02	502.89	471.71	461.83	452.71	442.25	441.54	428.49	**413.67**
2012	416.61	409.56	398.21	386.27	382.58	410.84	405.01	395.72	389.01	384.78	377.09	365.85	357.79	350.26	335.11	**344.71**
2013	376.78	369.00	360.70	337.30	341.79	397.33	389.89	372.01	353.67	320.67	309.04	296.78	281.84	271.85	262.07	**253.64**
2014	287.84	281.25	270.37	265.81	265.44	311.19	303.34	272.91	244.79	222.68	214.42	207.36	203.35	196.17	185.49	**190.84**
2015	252.16	248.02	247.60	233.93	236.52	276.65	270.01	249.81	231.00	195.94	181.63	170.66	164.98	157.30	143.08	**114.62**
2016	238.97	229.28	231.36	223.33	226.31	262.38	258.66	238.37	220.35	188.19	179.56	175.74	173.29	168.08	156.14	**143.88**
2017	337.27	330.48	324.50	309.57	295.79	351.64	348.01	336.32	322.53	280.39	269.51	262.71	256.41	250.20	230.62	**221.44**
2018	281.64	269.03	263.11	251.26	249.63	310.99	303.52	270.01	258.89	216.62	210.60	207.69	208.21	204.23	192.42	**198.64**
2019	288.48	282.83	272.43	269.69	253.46	302.26	297.65	282.80	274.16	253.27	245.05	239.71	236.14	231.72	220.48	**220.13**
2020	350.04	319.42	318.86	288.92	258.73	357.89	355.61	340.38	326.16	275.13	255.31	241.96	236.43	233.91	224.99	**221.48**
2021	**460.51**	**444.35**	**435.52**	**424.43**	**414.73**	**636.87**	**632.78**	**593.90**	**544.77**	**445.75**	**409.76**	**401.78**	**401.73**	**395.05**	**386.50**	**363.24**

2.10.8.1. රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබා ගත් මිලෙහි මාසික සාමාන්‍යය

රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබා ගත් මිලෙහි මාසික සාමාන්‍යය (Farm Gate Price) 2021						
මාසය	ෂීට් රබර් (ආර්.එස්.එස්)					ලේටෙක්ස් (රබර් කිරි)
	1	2	3	4	5	
ජනවාරි	397.42	390.94	387.33	381.68	380.48	329.32
පෙබරවාරි	412.51	401.86	397.55	387.19	383.88	354.42
මාර්තු	420.28	409.71	408.07	398.02	396.57	359.61
අප්‍රේල්	419.97	414.25	409.65	398.90	396.82	394.80
මැයි	420.96	414.62	411.84	399.19	396.71	380.86
ජූනි	439.29	432.50	451.07	410.43	405.19	377.50
ජූලි	425.42	423.85	411.14	398.77	392.08	426.81
අගෝස්තු	438.32	415.52	423.47	397.87	393.23	401.80
සැප්තැම්බර්	454.50	411.25	403.75	403.75	395.00	419.17
ඔක්තෝබර්	447.06	432.81	416.36	411.96	407.41	424.81
නොවැම්බර්	464.59	453.41	448.67	440.32	434.75	437.01
දෙසැම්බර්	490.93	471.51	464.33	459.63	450.41	425.01
සාමාන්‍ය අගය	**435.94**	**422.69**	**419.44**	**407.31**	**402.71**	**394.26**

වගු අංක XL

අන්තර් ජාතික රබර් මිල (2015-2021)

වර්ෂය	ශ්‍රී ලංකා රුපියල්			
	ශ්‍රී ලංකාව කොළඹ (RSS 3)	බැංකොක් තායිලන්තය (RSS 3)	කොච්චියාම් ඉන්දියාව (RSS 4)	සයිකොම් සිංගප්පූරුව (RSS 3)
2015	247.60	213.97	259.61	216.43
2016	231.36	250.45	271.85	211.77
2017	324.50	311.69	322.75	307.70
2018	263.11	257.00	301.80	256.01
2019	272.43	296.90	343.08	297.05
2020	318.86	327.01	339.82	322.17
2021	**435.52**	**389.13**	**443.64**	**416.54**

වගු අංක XLI

2.11. බලපත්‍රලාභී රබර් වෙළඳුන් පිළිබඳ තොරතුරු

දෙපාර්තමේන්තුවේ කාර්යයන් අතර එක් කාර්යයක් වන්නේ බලපත්‍ර නිකුත් කිරීමේ හා අලුත් කිරීමේ කාර්යයි. රබර් මිලදී ගැනීම සඳහා වෙළෙඳුන් විසින් බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය වන අතර බලපත්‍ර ලබා ගත් වෙළඳුන්ගේ බලපත්‍ර වාර්ෂිකව අලුත් කිරීම ද අනිවාර්ය වේ. 2021 වසරේදී දිස්ත්‍රික්ක වශයෙන් රබර් වෙළඳුන් සඳහා බලපත්‍ර ලබා දුන් ආකාරය පහත වගුවේ දැක්වේ.

දිස්ත්‍රික්කය	අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව	නිකුත් කළ නව බලපත්‍ර සංඛ්‍යාව	මුළු බලපත්‍ර සංඛ්‍යාව
රත්නපුර	125	5	130
කොළඹ	39	0	39
මොනරාගල	22	13	35
අම්පාර	0	1	1
ගාල්ල	25	3	28
මාතර	30	0	30
කෑගල්ල	113	15	128
ගම්පහ	14	0	14
කුරුණෑගල	2	1	3
මහනුවර	7	0	7
කළුතර	122	11	133
එකතුව	**499**	**49**	**548**

වගු අංක XLII

2021 වර්ෂයේ රබර් වෙළඳුන් විසින් බලපත්‍ර 499 ක් අලුත් කරන ලද අතර, දෙපාර්තමේන්තුව මගින් නව බලපත්‍ර 49 ක් නිකුත් කර ඇත.

2.12. ඒකාබද්ධ අරමුදල

වියදම් විෂය		වෙන් කළ	2021.12.31 දිනට
		ප්‍රතිපාදනය (රු.)	ශුද්ධ වියදම (රු.)
පුනරාවර්තන වියදම්			
වැටුප් හා වේතන	1001	193,000,000.00	175,813,557.61
අතිකාල හා නිවාඩු දින වැටුප්	1002	6,670,000.00	6,376,743.84
වෙනත් දීමනා	1003	73,800,000.00	64,376,747.08
ගමන් වියදම් - දේශීය	1101	11,000,000.00	10,830,541.52
ගමන් වියදම් - විදේශීය	1102	4,000,000.00	-
ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	1201	6,320,000.00	6,239,285.13
ඉන්ධන	1202	8,400,000.00	8,094,487.62
ආහාරපාන සහ නිල ඇඳුම්	1203	760,000.00	743,074.82
වෙනත් සැපයුම්	1205	500,000.00	470,370.80
වාහන නඩත්තු	1301	6,000,000.00	5,923,829.49
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු	1302	500,000.00	440,806.85
ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු	1303	830,000.00	793,980.98
තැපැල් සහ සන්නිවේදන	1402	5,800,000.00	5,603,222.06
විදුලිය සහ ජලය	1403	2,000,000.00	1,749,654.48
බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු	1404	46,700,000.00	39,721,506.87
මෙහෙයුම් කල්බදු වාහන සඳහා වාරික ගෙවීම්	1408	12,300,000.00	9,780,000.00
වෙනත් (පිරිසිදු කිරීම් / ආරක්ෂක සේවා)	1409	10,047,860.00	9,869,887.69
සංවර්ධන සහනාධාර	1504	952,140.00	952,140.00
සම්මාදම් සහ දායක මුදල්	1505	10,800,000.00	-
රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී	1506	1,720,000.00	1,667,010.27
එකතුව (පුනරාවර්තන වියදම්)		**402,100,000.00**	**349,446,847.11**
මූලධන වියදම්			
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2001	5,500,000.00	5,412,196.76
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2002	1,500,000.00	845,113.25
නඩත්තු හා වැඩි දියුණු කිරීම්-වාහන	2003	4,000,000.00	3,819,614.64
ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	2102	2,000,000.00	1,915,775.04
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2103	500,000.00	486,985.61
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2104	-	-
මෘදුකාංග සංවර්ධනය	2106	2,000,000.00	-
කාර්ය මණ්ඩල පුහුණු	2401	1,500,000.00	1,038,192.32
සංවර්ධන සහායන්	2202	900,000,000.00	896,807,913.95
පර්යේෂණ සහ සංවර්ධන	2507	10,000,000.00	5,835,192.73
එකතුව (මූලධන වියදම්)		**927,000,000.00**	**916,160,984.30**
එකතුව (සම්පූර්ණ)		**1,329,100,000.00**	**1,265,607,831.41**

වගු අංක XLIII

2.13. සෙස් බදු අය කිරීම.

ශ්‍රී ලංකාව තුළ රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන්ගෙන් එම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය වශයෙන් මිල දී ගන්නා ස්වාභාවික රබර් සඳහා සෙස් බදු අය කරනු ලැබේ.

2007 අංක 01 දරණ සෙස් බදු නියෝගවලට අනුව මිලදී ගනු ලබන අමු රබර් කි.ග්‍රෑ 1 ක් සඳහා රු. 4/- බැගින් සෙස් බද්දක් ගෙවිය යුතුය. එම බදු මුදල් ''අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව'' නමට ලියන ලද චෙක්පතක් මගින් යොමු කළ යුතුය.

සෙස් බදු සඳහා ලියාපදිංචි ආයතන විස්තරය - 2021

2021 වර්ෂය සඳහා ලියාපදිංචි මුළු ආයතන සංඛ්‍යාව	-	149
සෙස් බදු ගෙවනු ලබන ආයතන සංඛ්‍යාව	-	59
සෙස් බදු නොගෙවූ ආයතන සංඛ්‍යාව	-	90

දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව– 2021

මාසය	දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)
ජනවාරි	19.47
පෙබරවාරි	34.04
මාර්තු	29.36
අප්‍රේල්	15.01
මැයි	-
ජුනි	27.08
ජූලි	16.56
අගෝස්තු	12.95
සැප්තැම්බර්	32.24
ඔක්තෝබර්	16.87
නොවැම්බර්	23.10
දෙසැම්බර්	16.57
එකතුව	**243.25**

වගු අංක XLIV

සෙස් බදු නියෝගවලට අනුව රබර් ආනයනය හා අපනයනය මත අය කරන ලද සෙස් බදු මුදල් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

අපනයනය හා ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව– 2021

මාසය	ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)	අපනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)
ජනවාරි	289.02	6.36
පෙබරවාරි	411.83	4.23
මාර්තු	506.01	9.31
අප්‍රේල්	434.80	4.76
මැයි	379.22	3.15
ජුනි	537.99	4.54
ජූලි	319.34	4.59
අගෝස්තු	337.50	6.15
සැප්තැම්බර්	340.86	7.57
ඔක්තෝබර්	249.72	4.89
නොවැම්බර්	305.03	4.34
දෙසැම්බර්	373.30	4.00
එකතුව	**4,484.62**	**63.89**

වගු අංක XLV

දේශීය පරිභෝජනය අනුව 2015 සිට 2021 දක්වා මුළු සෙස් බදු අයකිරීම් පිළිබඳ විස්තර

වසර	බදු අයකිරීම (රු.)
2015	169,315,461.01
2016	169,826,685.48
2017	216,985,124.32
2018	211,268,567.06
2019	226,827,187.71
2020	206,301,176.37
2021	243,246,404.03

වගු අංක XLVI

3. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එල්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	අයවැය 2021	සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ -1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		870,420,000	861,071,000	ඒසිඒ -3
-	තැන්පතු		120,498,664	30,534,784.00	ඒසිඒ -4
-	අත්තිකාරම් ගිණුම්		20,956,392	16,826,392.00	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**1,011,875,056**	**908,432,176**	
-	මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)		**1,011,875,056**	**908,432,176**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)				
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ) – (ඇ)		1,011,875,056	908,432,176	
	අඩු කලා- වියදම්				
	පුනරාවර්තන වියදම්		-		
275,000,000	වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	246,567,049	257,486,445	
113,800,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	100,242,823	94,897,792	ඒසිඒ 2(ii)
13,300,000	සහනාධාර, ප්‍රදාන හා මාරු කිරීම්	7	2,619,150	3,044,453	
	පොළී ගෙවීම්	8	-	-	
	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	

402,100,000	මුළු පුනරාවර්තන ව්යදම්(ඊ)		**349,429,022**	**355,428,690**	
	මූලධන ව්යදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
11,000,000	වැඩිදියුණු කිරීම්	10	10,076,925	11,075,028	
4,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	2,402,761	2,785,051	
900,000,000	ප්‍රාග්ධන මාරු කිරීම්	12	896,807,914	823,010,127	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,500,000	හැකියා වර්ධනය	14	1,056,017	1,222,705	
10,000,000	වෙනත් මූලධන ව්යදම්	15	5,835,193	9,410,707	
927,000,000	**මුළු මූලධන ව්යදම් (උ)**		**916,178,810**	**847,503,618**	
	තැන්පතු ගෙවීම්		121,470,510	32,424,911	ඒසිඒ -4
	අත්තිකාරම් ගෙවීම්		23,155,940	19,982,880	ඒසිඒ -5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් ව්යදම් (ඌ)		144,626,450	52,407,791	
	මුළු ව්යදම් එ = (ඊ+උ+ඌ)		1,410,234,282	1,255,340,099	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)		(398,359,226)	(346,907,923)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(398,359,226)	(346,907,923)	ඒසිඒ -6
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසිඒ -3
			-	-	

වගු අංක XLVII

3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය ව්යදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	402,100,000.00	402,100,000.00	349,429,022.11	86.90%
ප්‍රාග්ධන	927,000,000.00	927,000,000.00	916,178,809.30	98.83%

වගු අංක XLVIII

3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

අදාළ නොවේ.


3.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහය	181,929,111.60	181,929,111.60		
9152	යන්ත්‍රෝපකරණ	227,976,578.29	227,976,578.29		
9153	ඉඩම්	408,370,800.00	408,370,800.00		
9154	අස්පෘශ්‍ය වත්කම්	789,006.00	789,006.00		
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරී ගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

වගු අංක XLIX

3.5. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAL/E/RDD/02/21/05

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 ජූනි 17 දින

වැඩිලි කර්මාන්ත අමාත්‍යාංශය 18 JUL 2022 ගිණුම් අංශය

වැඩිලි කර්මාන්ත අමාත්‍යාංශය 21 JUN 2022 සෙයිකිපාය අදියර II,බත්තරමුල්ල.

ගණන්දීමේ නිලධාරී

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය නොකළ මතය**

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරයව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
3.5	දෙපාර්තමේන්තුව සතු වාහන 08 කට අදාළව සිදුව තිබුණු අනතුරු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අලාභ මුළු වටිනාකම රු.2,466,640 ක් වූ අතර මෙම අලාභයන් මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	වාහන සඳහා වූ අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය .

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.1.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021 /03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 7.6 ඡේදය පරිදි රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ හරස් සටහන් මගින් ලැබීම් සහ ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවද හරස් සටහන් මගින් ලැබීම් රු.3,519,253 ක් ද, හරස් සටහන් මගින් ගෙවීම් රු. 3,519,253 ක් ද ඇතුළත් කර නොතිබුණි.

.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

මූ. රෙ. 94(1) පරිදි දරන ලද බැරකම් හා වැය ප්‍රමාණය කිසිම විටක වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ 293-2-1-2202 සංවර්ධන සහායන් සඳහා වූ වැය විෂයය යටතේ ප්‍රතිපාදන ඉතිරිය රු.3,192,086 ක් වුවද, බැරකම් වටිනාකම රු.45,622,099 ක් වූ හෙයින් ඉතිරිය ඉක්මවූ බැරකම් වටිනාකම රු.42,430,013 ක් වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.23,100,000 ක ප්‍රතිපාදනවලින්, එකතුව රු.13,320,000 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට එම වැය විෂයන්වල ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 100 දක්වා සැලකිය යුතු පරාසයක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.15,000,000 ක ප්‍රතිපාදනවලින්, එකතුව රු.7,263,677 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට එම වැය විෂයන්වල ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 සිට සියයට 100 දක්වා සැලකිය යුතු පරාසයක පැවති බව නිරීක්ෂණය විය.

2.2 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 07 ත් වර්ෂ 03 ත් අතර කාලයක් ගත වී ඇති සිද්ධීන් 09 ක් සම්බන්ධයෙන් එකතුව රු. 3,159,640 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

3. මානව සම්පත් කළමනාකරණය

3.1 අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව තත්‍ය සංඛ්‍යාව හා පුරප්පාඩු පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	37	23	14
තෘතීයික මට්ටම	24	11	13
ද්විතීයික මට්ටම	339	283	56
ප්‍රාථමික මට්ටම	84	65	19
	---	---	---
	484	382	102
	====	===	===

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 14 යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධ්‍යක්ෂ තනතුරු 02 ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 04 ක් සහ ගණකාධිකාරී සේවයේ තනතුරු 03 ක් සඳහා 2020 වර්ෂයේ සිට නිලධාරීන් අනුයුක්ත කරවා ගෙන නොතිබුණි.

(ආ) 2019 වර්ෂයේදී රබර් සංවර්ධන නිලධාරීන් 19 දෙනෙකු බඳවා ගැනීමට ලිඛිත පරීක්ෂණයක් පවත්වා 2021 ජූනි මාසයේදී පත්වීම් ලබාදෙන අවස්ථාවේදී අයදුම්කරුවන් 13 දෙනෙකු එම පත්වීම භාරගෙන නොතිබුණි. 2021 අගෝස්තු මාසයේදී වැවිලි අමාත්‍යාංශය විසින් නැවතත් රබර් සංවර්ධන නිලධාරීන් 55 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබාදීමත් සමගම දෙපාර්තමේන්තුව විසින් 2021 සැප්තැම්බර් මාසයේදී බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකර තිබුණි. ඒ සඳහා අයදුම්කරුවන් 281 දෙනෙකු දෙසැම්බර් මාසයේදී ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටියද මෙතෙක් කිසිවකු බඳවා ගෙන නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ රබර් සංවර්ධන නිලධාරීන්ගේ කාර්ය භාරයට රබර් ඉඩම් සහ ඒවායේ හිමිකරුවන් ප්‍රාදේශීය කාර්යාල හරහා ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම සහ රෝපණ ද්‍රව්‍ය, පොහොර සහ සහනාධාර ලබා දීම. අලුතින් වගා කිරීම සහ නැවත වගා කිරීම සඳහා සහනාධාර ක්‍රමය පරිපාලනය කිරීම සහ දිස්ත්‍රික් කාර්යාල හරහා සහනාධාර බෙදා හැරීම. උසස් තත්වයේ රබර් පැල නිෂ්පාදනයට මහපෙන්වීම සිදුකරනු ලබයි මෙම තත්ත්වයන් නිසි පරිදි සිදුවීමට අනුමත තනතුරු 187 කින් තනතුරු 55 ක් පුරප්පාඩුව පැවතුණි.

ආර්.එම්.රත්නායක
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ආර්.එම්. රත්නායක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

3.6. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	තත්‍ය 2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	819,065,496	816,422,674
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	52,129,215	49,929,667
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**871,194,711**	**866,352,341**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		46,633,324	43,461,930
දේපළ පිරියත හා උපකරණ සංචිතය		819,065,496	816,422,674
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
සංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසීඒ-4	5,495,891	6,467,737
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**871,194,711**	**866,352,341**

පිටු අංක...01.....සිට ...23..... දක්වා **ඒසීඒ ඒෆ්** සිට **ඒසීඒ 7** දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ...24..... සිට .....29.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරවි කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, රිට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්නාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2022.02.24.	දිනය : 2022.02.24	දිනය : 2022.02.22
ජේ. එම්. තිලකරත්න බණ්ඩා ලේකම් පළාත් පාලන ආයතන, නේ හා රබර් වතු ආශ්‍රිත පෝෂක වගා සහ ඒවාගේ වගා වර්ධනය හා නේ හා රබර් අපනයන පුවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 9 වන මහල, පෙත්තිට්ටාය II අදියර, බත්තරමුල්ල.	මාධව වර්ණකුලසූරිය අධ්‍යක්ෂ ජනරාල් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව අංක. 465, ගහතේන, බත්තරමුල්ල.	එච්.එච්.එස්.ආර්. ජෝන්සේක ප්‍රධාන ගණකාධිකාරි රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව අංක. 465, ගහතේන, බත්තරමුල්ල.

2

3.7. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තක්ෂ	
	2021 රු.	**2020** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු ,අධිභාර, දඩමුදල් හා බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	399,227,461	346,962,149
අග්‍රිම ලැබීම්	870,420,000	861,071,000
අත්තිකාරම් අයකර ගැනීම්	17,403,083	13,184,197
තැන්පතු ලැබීම	120,498,664	30,534,784
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (අ)	**1,407,549,208**	**1,251,752,130**
අඩුකළා : මුදල් වැයකිරීම්		
පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම්	346,779,160	352,384,237
සහනාධාර සහ මාරුකිරීම් වියදම්	2,619,150	3,044,453
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	972,642	2,765,690
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	19,632,687	14,937,617
තැන්පතු ගෙවීම්	121,470,510	32,424,911
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයන් (ආ)	**491,474,149**	**405,556,908**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඇ)=(අ)-(ආ)	916,075,059	846,195,222
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-

උපණය අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඇ)	-	-
අඩුකළා - මුදල් වැයකිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	916,075,059	846,195,222
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	916,075,059	846,195,222
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්(ඊ)=(ඇ)-(ඉ)		
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	**916,075,059**	**846,195,222**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඌ)	-	-
අඩුකළා - මුදල් වැයකිරීම්		
දේශීය ණය ආපසුගෙවීම්	-	-
විදේශීය ණය ආපසුගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

වගු අංක L

4. කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	ඉලක්කය	ප්‍රගතිය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම
1. නැවත වගා කළ බිම් ප්‍රමාණය - කුඩාවතු (හෙක්.)	500	560	112%
2. නැවත වගා කළ බිම් ප්‍රමාණය - වැවිලි සමාගම් (හෙක්.)	1000	906	90.6%
3. නව වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	400	365.69	91.4%
4. රබර් පැළ නිෂ්පාදනය - දෙපාර්තමේන්තු පැළ තවාන්වල (පැළ)	1 300 000	1,277,232	98.2%
5. වැහි ආවරණ යෙදූ ඉඩම් ප්‍රමාණය - කුඩා වතු (හෙක්.)	500	1,236.49	247.3%
6. වැහි ආවරණ යෙදූ ඉඩම් ප්‍රමාණය - වැවිලි සමාගම් (හෙක්.)	3000	4561.43	152%
7.අතුරු බෝග වගාව (හෙක්.)	400	274.95	68.7%
8. රබර් කිරි කැපීම සාමාන්‍ය පුහුණුව ලැබූ සංඛ්‍යාව - (පුද්ගලයන්)	1200	535	44.5%
9. බද්ධ පුහුණුව ලැබූ සංඛ්‍යාව (පුද්ගලයන්)	240	132	55%

වගු අංක LI

5. තිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්කය	ප්‍රගතිය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය
විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.	1. නව වගාව - කුඩා වතු සඳහා හෙක්. 400 2. නැවත වගාව - කුඩා වතු සඳහා හෙක්. 500	365.69 560	හෙක්. හෙක්.	91.4% 112%
2030 වන විට තිරසාර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ භානිකර කාලගුණ තත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම.	1. වැහි ආවරණ යෙදීම කුඩා වතු - හෙක්. 500 2. වැහි ආවරණ යෙදීම වැවිලි සමාගම් - හෙක් 3,000 3. අතුරු බෝග වගා කිරීම හෙක්. 400	1,236.49 4561.43 274.95	හෙක්. හෙක්. හෙක්.	247.3 % 152% 68.7%
2021 වන විට බීජවල, වගාකරන ලද ශාකවල සහ ගොවිපළ සහ ගෘහාශ්‍රිත සතුන්ගේ ජානමය විවිධත්වය පවත්වාගෙන යාම සහ හොඳින් කළමනාකරණය කරන ලද සහ විවිධත්වයන්ගෙන් යුත් බීජ සහ ශාක බැංකු ජාතික කලාපීය සහ අන්තර්ජාතික මට්ටමින් පවත්වාගෙන	රජයේ පැළ තවාන්වල බද්ධ රබර් පැළ නිෂ්පාදනය පැළ 1,300,000 ක් නිෂ්පාදනය කිරීම.	1,277,232	හෙක්.	98.2%

යාම සහ අන්තර්ජාතික වශයෙන් එකඟ වූ ආකාරයට ජාන සම්පත් සහ පාරම්පරික දැනුම උපයෝගි කරගැනීම මගින් ලබාගන්නා වූ ප්‍රතිලාභවලට ප්‍රවේශවීම සහ සමානව භුක්ති විඳීම තහවුරු කිරීම.				
විශේෂයෙන් අවම වශයෙන් දියුණු වූ රටවල් ඇතුළුව දියුණු වෙමින් පවත්නා රටවල කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා, ඉහළ නංවන ලද අන්තර්ජාතික සහයෝගීතාවයෙන් ග්‍රාමීය යටිතල පහසුකම්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන්, තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදු කරන ආයෝජන වැඩි කිරීම.	කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ලබාදීම - පුද්ගලයන් 1200 බද්ධකරුවන් පුහුණු කිරීම පුද්ගලයන් 240	535 132	පුද්ගලයන් පුද්ගලයන්	44.5% 55%
2020 වන විට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයට ප්‍රවේශවීමේ හැකියාව කැපී පෙනෙන ආකාරයට වර්ධනය කිරීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට අඩු මිලට සහ සැමටම අන්තර්ජාලය වෙත ප්‍රවේශවීමේ අවස්ථාව සැලසීමට ප්‍රයත්න දැරීම.	දෝෂ සහිත පරිගණක හා උපාංග අළුත්වැඩියා කිරීම ලිපි ගොනු කළමණාකරණ මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම. RIMS මෘදුකාංගයේ සේවා ගිවිසුම් සඳහා අනුදේශ සැකසීම සහ එහි තාක්ෂණික හා මූල්‍ය යෝජනා කැඳවීම හා තාක්ෂණික ඇගයීම් අවසන් කිරීම.			
2030 වන විට ආබාධිත පුද්ගලයන් සහ යෞවනයින්ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථා ලබාදීම. කාලගුණ වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම.	කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ලබාදීම - පුද්ගලයන් 1200 වැසි ආවරණ යෙදීමේ පුහුණුව ලබා දීම -600 පාංශු සංරක්ෂණ පුහුණුව ලබා දීම - 300	535 529 124	පුද්ගලයන් පුද්ගලයන් පුද්ගලයන්	44.5% 88.1% 41.3%

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2021 වර්ෂයේ දී රබර් නව වගාව සහ නැවත වගාව මගින් හෙක්ටයාර 1,832ක් වගා කරමින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට දායකත්වය ලබා දී ඇත. එසේම කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් හෙක්ටයාර 822 ක් ද, වැවිලි සමාගම් මගින් නව වගාව හෙක්ටයාර 2 ක් ද වගා කරමින් දායක වී ඇත. මෙමගින් වන ආවරණය වැඩි වීම තුළින් වායුගෝලීය ඔක්සිජන් ප්‍රතිශතය ඉහළ නැංවීමට දායක වීම තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම යටතේ ලද ජයග්‍රහණයකි. කොවිඩ් 19 වසංගතය හමුවේ ලංකාව තුළ විශාල පසුබෑමක් ඇතිවුවත් අපේක්ෂිත ඉලක්ක අභිබවමින් නැවත වගාව හා වැසි ආවරණ යෙදීම ආදි අංශයන් ඉහළ ප්‍රගතියක් ලබා තිබේ. එසේම වර්ෂා කාලයේ දී රබර් කිරි කැපීමට නොහැකි වුව ද නව තාක්ෂණය භාවිතා කරමින් වැසි ආවරණ යොදා ගැනීමෙන් වැසි දිනවල දී අස්වැන්න නෙලා ගැනීමට හැකි වීම ද ලද ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය.

6. මානව සම්පත් පැතිකඩ

6.1 . සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	37	25	12
තෘතියික	21	08	13
ද්විතියික	339	278	61
ප්‍රාථමික	84	65	19
කොන්ත්‍රාත්/ අනියම්	-	-	-

වගු අංක LIII

6.2. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රුපියල්)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
පශ්චාත් උපාධිය සඳහා පාඨමාලාව	07	වසර 01	351,500.00	-	දේශීය	වැඩි දැනුමක් ලබා ගැනීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී නිලධාරීන්
විෂයානුබද්ධ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම සහ සතුටින් වැඩ කිරීම.	12	දින 01	16,680.00	-	දේශීය	කාර්යාලය තුළ එකමුතුව වැඩ කිරීම, රාජකාරී ජීවිතය තුළ නිලධාරීන් ඇති කර ගත යුතු ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම, කොවිඩ් අභියෝගය යටතේ කායික හා මානසික සෞඛ්‍යය ආරක්ෂා කර ගෙන සතුටින් වැඩ කිරීම, පැවරී ඇති රාජකාරීන් කාර්යාක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම, කාර්යාලය තුළ
පවත්නා අභියෝග තත්ත්වය යටතේ සතුටින් වැඩ කිරීම.	46	දින 01	65,270.00	-	දේශීය	
ඵලදායිතාවය පිළිබඳ වැඩසටහන	28	දින 02	74,268.28	-	දේශීය	

කාර්යාල ක්‍රම / අන්තර් පුද්ගල සබඳතා	64	දින 01	64,223.00	-	දේශීය	විධිමත්ව රාජකාරි ඉටු කිරීම හා රාජකාරි ඉටු කිරීමේදී සියලු දෙනා සමඟම සහයෝගයෙන් කටයුතු කිරීම

වගු අංක LIV

6.3. රජයේ පැළ තවාන්වල සේවක සංඛ්‍යාව - 2021.12.31 දිනට

තවානේ නම	සේවක සංඛ්‍යාව (කොන්ත්‍රාත් පදනම)
වැලිකඩමුල්ල තවාන	50
මීරිගම තවාන	37
ඇඟල්ඔය තවාන	40
ගුරුගොඩ තවාන	39
කරපිංච තවාන	23
කුඹුක්කන තවාන	81
පදියතලාව තවාන	34
මිද්දෙනිය තවාන	18
එකතුව	322

වගු අංක LV

6.4. ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්හි දායකත්වය

පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කිරීමෙන් ඔවුන්ගේ විෂයානු බද්ධ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම තුළින් ඔවුන් කාර්යාක්ෂමව හා ඵලදායීව සේවය කිරීම නිසා ආයතනයේ කාර්ය සාධනය වැඩි කර ගැනීමට හැකි වේ. මේ සඳහා පුහුණු වැඩසටහන් දායක වේ.

වැඩසටහනේ නම	සහභාගී වූ සංඛ්‍යාව	වියදම (රු.)
කාර්යාල පටිපාටි කාර්යාල කටයුතු සඳහා යොදා ගැනීම.	**1**	5,000.00
රාජ්‍ය මූල්‍ය පරිපාලනය	5	25,000.00
රාජ්‍ය විනය පටිපාටිය	3	15,000.00
සාමාන්‍ය කාර්යාල පරිපාලනය	3	15,000.00

පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව හා පවත්වාගෙන යාම	20	11,600.00
භාණ්ඩ සමීක්ෂණය	5	17,500.00
රජයේ ප්‍රසම්පාදන කළමණාකරණ සහතිකපත්‍ර පාඨමාලාව	3	30,000.00
Create Professional Document using MS word	3	6,000.00
Effective use of internet & Email	4	8,000.00
Essential IT Skills	3	10,500.00
Essential in Project Management	3	15,000.00
රජයේ වාහන නඩත්තුව	2	10,000.00
MS Excel for Government Officers	3	10,500.00
General Administration & E – Code	2	10,000.00
Stores and Inventory Management	3	15,000.00
Online Workshop on Research Methodology	1	5,000.00
Preparation of Spread sheet – MS Excel	2	4,000.00
Personal File Management	3	5,000.00
මී මැසි පාලන පුහුණු වැඩසටහන -ගාල්ල	20	143,000.00
භාණ්ඩ සමීක්ෂණය -ප්‍රධාන කාර්යාලය	26	27,000.00
භාණ්ඩ සමීක්ෂණය -කළුතර	24	13,500.00
භාණ්ඩ සමීක්ෂණය -ගාල්ල	20	18,000.00
රාජ්‍ය ආයතනයන්හි කාර්යක්ෂමතා වර්ධනය	2	2,000.00
Office Management & Administration (Kegalle & Rathnapura)	2	20,000.00

6.5. 2021 වර්ෂයේ ඉදි කිරීම් ප්‍රගතිය

වැඩ විෂය	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	භෞතික ප්‍රගතිය %	වියදම (රු.මි.)
මොනරාගල ප්‍රාදේශීය කාර්යාලයේ වහල අළුත්වැඩියා කිරීම.	0.500	100%	0.344
කරපිංච තවාන කාර්යාලය අලුත්වැඩියාව	0.100	100%	0.095
කරපිංච තවාන නිල නිවස වහලය අලුත්වැඩියාව	1.000	100%	1.075
කරපිංච තවාන නිල නිවස වහලය අලුත්වැඩියාව- අතිරේක ඇස්තමේන්තුව	0.075		
තෝලංගමුව නිල නිවාසයේ යාබද පැති බැම්ම ඉදි කිරීම	0.190	100%	0.184
දෙහිඕවිට අංක - 02 රබර් සංවර්ධන නිල නිවාසය අළුත්වැඩියා කිරීම	1.100	100%	0.897
දෙහිඕවිට නිල නිවාසවල අළුත්වැඩියා කිරීම	0.200	100%	0.176
අගලවත්ත ර.සං.නි.කාර්යාලය අළුත්වැඩියා කිරීම	1.100	100%	1.028
ගුරුගොඩ තවානේ කාර්යාල වහල අළුත්වැඩියා කිරීම	0.960	100%	0.887
ඇල්පිටිය ර.සං.නි. කාර්යාලය අළුත්වැඩියා කිරීම	0.800	100%	0.726
කුඹුක්කන රජයේ රබර් පැල තවානෙහි අලිවැට ඉදි කිරීම.	1.000	70%	0.246
කුඹුක්කන රජයේ රබර් පැල තවානෙහි කොම්පොස්ට් පොහොර සැකසුම් ඒකකය ඉදි කිරීම.	0.390	100%	0.381
කරපිංච තවාන විසුරුම් ජල පද්ධතිය	1.970	100%	1.417
මිරිගම පැළ තවානේ ජල නල පද්ධතිය වැඩි දියුණු කිරීම	0.300	100%	0.150
වැලිකඩමුල්ල පැළ තවානේ ජල නල පද්ධතිය වැඩි කිරීම.	0.300	100%	0.421
ඇගල්ඔය තවානේ පොම්ප කාමරය සකස්කිරීම.	0.200	100%	0.188
මිද්දෙණිය තවානේ දැල් ගෘහය ඉදිකිරීම.	0.400	100%	0.399
දේවාලකන්ද යෝජිත තවානේ වැට ඉදි කිරීම.	0.930	-	0.000
ඇත්නාවල බද්ධ අතු තවාන සකස් කිරීම.	1.000	-	0.000
ඇත්නාවල වැට සකස් කිරීම.	1.200	50%	0.499

වගු අංක LVII

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	වෙනත්	අනුකූල වේ.		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.5	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.6	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.9	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම.	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA /1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			

7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසුවර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂය නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	නිරවුල් නොවී පවතින හිඟ ශේෂ වසර 16 කට අධික වන බැවින් නීතිපති වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත. වැඩ තහනම් කර ඇති නිලධාරියාගේ ණය ශේෂ නීතිපති වෙත යොමු කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත. (පදිංචිය තහවුරු කර ගැනීම අසීරු තත්ත්වයක පැවති බැවිනි.)	
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			

14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කොට තිබීම.	අනුකූල වේ.		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2018 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		